ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

30 වෙළුම 9-10 කලාපය 2011 සැප්තැම්බර් - ඔක්තෝබර්



# විසඳුමක් ද? ගැටලුවක් ද?

ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# විසඳුමක් ද? ගැටලුවක් ද?

තෙවසරකට පෙර පැන නැඟුණු ගෝලීය ආර්ථික අර්බුදය විසින් ලෝක ව්‍යාප්ත අධිකාරයක් දරන ණය ශ්‍රේණිගත කිරීම් ආයතන තුනෙහි යහ භාවිතය ප්‍රශ්න කෙරිණි. උප ප්‍රමුඛ ණය අර්බුදයට වගකිව යුතු මූලික ම පාර්ශ්වයක් වශයෙන් ඒ ආයතනවලට වරද පැටවිණි. ඔවුන් කළ වරද ලෙසින් සඳහන් වූයේ අධි අවදානම් සහිත උප ප්‍රමුඛ ණය සඳහා ඉහළ ශ්‍රේණි ලබාදීම මඟින් ආයෝජකයන් නො මඟ යැවූ බව ය. මෑත කාලයේ දී, එම ආයතන විසින් PIGS රටවල (පෘතුගාලය, අයර්ලන්තය, ග්‍රීසිය සහ ස්පාඤ්ඤය) ණය ශ්‍රේණි පහත හෙළීම නිසා එම රාජ්‍යයන් අර්බුදයකට යොමු කළ බවට ද චෝදනාවක් වෙයි. එම රටවලට එරෙහි ව නැඟූ බියසන් සීනු හඬින් ගෝලීය මූල්‍ය අර්බුදයේ සැබෑ හේතුකාරකයා සැඟ වූ බවට ද වරද අන් අය මත ලූ බවට ද එම චෝදනාවෙන් කියැවෙයි. දැන් යූරෝ කලාපය ම අර්බුදයකට හෙළා ඇත. මෙම පසුබිම තුළ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ක්‍රියාකාරිත්වය ප්‍රශ්න කෙරී ඇත. එම ආයතන පිළිබඳ කරුණු ඇතුළත් විස්තරාත්මක ලිපියක් මෙ වර "සටහන" තුළින් ඔබ වෙත ගෙන එන්නේ එ වන් වාතාවරණයක් පවතින අතරතුර ය. එ හෙයින්, එම විමසුමෙහි කාලෝචිත බව සම්බන්ධයෙන් ගැටලුවක් නො වේ.

ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මූල්‍ය වෙළෙඳපොළට පිවිසියේ එහි ක්‍රියාකාරිත්වය පහසු කරවීමේ හා ශක්තිමත් කරවීමේ කාර්යයභාරය උර මත රඳවාගෙන ය. විසිවන සියවස ආරම්භයේ දී ඔවුහු ඒ කාර්යය මැනැවින් ඉටු කළහ. එහෙත්, ඉනික්බිති ව ආර්ථික අවපාතය විසින් ලෝක ආර්ථිකය භීතියට පත් කරන තෙක් ඔවුන් කෙරෙහි වූ ඉල්ලුම නිශ්චිත හා ප්‍රමාණවත් එකක් නොවිණි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව වියැකී ගිය ද 1970 න් අනතුරු ව රන් සම්මතය අත්හැරීමෙන් පසු ලෝක ආර්ථිකය කැළඹීම් සහගත මාවතකට යොමුවීම නිසා ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට නැවතත් හොඳ කලක් උදාවිය. මෙම කරුණ විසින් තහවුරු කරනු ලබන අම්හිරි සත්‍යය වන්නේ ශ්‍රේණිගත කිරීමේ ආයතන අර්බුද මත යැපෙන බව ය.

එයට අමතර ව, දැනට රජකරන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල අධිකාරී බලය ද එම ආයතන එක ම එක රටක් කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වීම ද ප්‍රශ්න කෙරී ඇත. විශේෂයෙන් ම, එම ආයතන වැඩ කරන්නේ ලොව ලොකු ම ණයගැතියා වන ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇති ආයතන වශයෙනි. මෙම ඒක කේන්ද්‍රගත ණය ඇගැයීම් ක්‍රියාදාමය වෙනස් විය යුතු ද? ණය ඇගැයීම ගන්නාගෙන් දෙන්නාට විතැන් විය යුතු ද? මේ, අද වන විට ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ සංවාද කෙරෙන කරුණුවලින් ඉදිරියෙන් ම ඇති ඒවා වෙයි.

කෙ සේ වෙතත්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලින් ඉටු කෙරෙන පොදු මෙහෙය කිසි ලෙසකින් හෝ අවතක්සේරු කළ හැකි නො වේ. එම ආයතන නොවන්නට ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ මෙ තරම් සුමට ආකාරයකින් ක්‍රියාත්මක නො වීමට ඉඩ තිබුණි. ඔවුන් නොමැති විටෙක දී මූල්‍ය වෙළෙඳපොළෙහි පිරිවැය ද ඉතා අධික එකක් වෙයි. ඒ සියල්ලෙහි ප්‍රතිඵලය වනු ඇත්තේ ඉතා පසුගාමී ආර්ථික ඵලයක් ලෝකයට ශේෂ වීම ය. එ බැවින්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල දායකත්වය අගය කිරීම කිසි ලෙසකින් හෝ නො කළ යුත්තක් නො වේ.

එ බැවින් අද දවසේ කතාබහට ලක්විය යුත්තේ එම ආයතනවල පැවැත්ම නො වේ. පවතින අඩු ලුහුඬුකම් මගහරවා ගෙන ඒවා ඉදිරියට ක්‍රියාත්මක විය යුත්තේ කවරාකාරයකින් ද යන්න ය. මෙ වර "සටහන" පළ කොට ඇති ලිපියෙන් එම කරුණු සියල්ල සැකෙවින් නමුත් සාකච්ඡාවට ලක් කරයි. එ මඟින් අප ගේ පාඨකයන්ට ද ගෝලීය වශයෙන් කෙරෙන සංවාදයකට දායකවීමේ අවස්ථාව හිමිවන බව අපි විශ්වාස කරමු.

සටහන ISSN 1391-3697

2011 සැප්තැම්බර්/ඔක්තෝබර්

පිටපතක මිල : රු. 10.00
වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

| ලිපි යොමුව | පිටුව |
|---|---|
| ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන | 3 |
| බර්න්හාඩ් මෙහෙයුම | 10 |
| ලෝක මූල්‍ය සහ ආර්ථික අර්බුදය | 18 |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ගැන විමසීමක්

**තිලක් රංජීව ප්‍රියදර්ශන**

සහකාර අධ්‍යක්ෂ, මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

රටක ආර්ථික ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම ව පවත්වා ගැනීම සඳහා ආයෝජනයට දිරිදෙන, ආර්ථික වර්ධනයට උර දිය හැකි ශක්තිමත් මූල්‍ය පද්ධතියක් තිබීම අත්‍යවශ්‍ය ය. මූල්‍ය අංශය යනු විවිධාකාර ආයතනවලින් සහ ඒවා විසින් සපයන සේවාවලින් ගොඩ නැඟුණු එකකි. ණය/ සුරැකුම් යනු මූල්‍ය අංශය හා බැදුණු මූලික ම අංගයයි. ණය සහ ආයෝජනය අතර ඇත්තේ මනා සහසම්බන්ධතාවකි. ඕනෑ ම ආර්ථිකයක් පුබුදුවන ප්‍රධානතම ආර්ථික මෙවලම ආයෝජනය ය. ආයෝජනය වැඩි කිරීම තුළින් ආර්ථිකයේ සමාහාර ඉල්ලුම වැඩිකර ජාතික ආදායම ඉහළ නංවා ගැනීම කුමන රටක වුව ද මූලික ම ආර්ථික උපක්‍රමය වෙයි. එය සඵල කරගැනීමට නම්, ශක්තිමත් සහ කාර්යක්ෂම මූල්‍ය පද්ධතියක් පැවැතිය යුතු අතර එය මනා ස්ථායිතාවකින් පවත්වා ගත යුතු ය. මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුද වැළැක්වීමත් යහපත් බැංකු පද්ධතියක් පවත්වාගෙන යාමත් උදෙසා ඒ පිළිබඳ ගනුදෙනුකරුවන් ගේ විශ්වාසය තහවුරු කරන වැඩපිළිවෙලක් තිබිය යුතු ය. ඒ සඳහා මහ බැංකු ප්‍රමුඛ මූල්‍ය නියාමන ආයතන විසින් අපමණ වෙහෙසක් දරනු ලබයි. කෙ සේ වෙතත්, මූල්‍ය නියාමන ආයතනවල බල ප්‍රදේශ ඒ ඒ රටවලට සහ කලාපවලට සීමා වෙයි. මූල්‍ය ආයතන වෙතින් සේවා ලබන්නේ පුද්ගලයින් සහ සමාගම් පමණක් නො වේ. රාජ්‍යයෝ ද මූල්‍ය සේවා පතා වෙළෙඳපොළට පැමිණෙති. මේ නිසා, මූල්‍ය අංශයේ සියලු පාර්ශ්වකරුවන් ආවරණය කෙරෙන නිරීක්ෂණ හා වාර්තාකරණ වැඩපිළිවෙලක් ද පවත්වාගෙන යා යුතු ය. ලොව විසිරී පවත්නා ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන (Credit Rating Agencies) විසින් ඉටු කරන්නේ එම සේවය යි. මෙම ලිපියෙන් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන පිළිබඳවත් ඒවායෙහි කාර්යභාරය පිළිබඳවත් සැකෙවින් කරුණු විමසා බැලේ.

## ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාදාමය

මූල්‍ය වෙළෙඳපොළෙහි ඇති ප්‍රධාන පෙළේ හිඟ ඒකක තම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට අනුගමනය කරන්නා වූ ක්‍රම දෙකක් වෙයි. කොටස් ප්‍රාග්ධනය එක් ක්‍රමයකි. විවිධාකාර මූලාශ්‍රවලින් ලබා ගන්නා ණය අනෙක් ක්‍රමය යි. ආයෝජකයන්ගෙන් සෘජුව ම ලබාගන්නා කොටස් ප්‍රාග්ධනය සාමාන්‍යයෙන් සමාගම පවතින තෙක් ම ආපසු ගෙවීමක් සිදු නො වේ. එහි දී ආයෝජිත සමාගමේ හෝ ව්‍යාපෘතියේ හෝ සියලු අවදානම් කොටස්කරුවන් විසින් ම දරනු ලබයි. ඒ සඳහා ප්‍රතිලාභ ලෙස ලාභාංශ ගෙවීම සිදු කෙරේ. නමුත් සමාගමක් හෝ කිසියම් ව්‍යාපෘතියක් හෝ විසින් ලබා ගන්නා කෙටිකාලීන/ දිගුකාලීන ණයක් පිළිබඳ වගකීම එයට හාත්පසින් ම වෙනස් පදනමක් මත රැඳී පවතියි. ලබා ගන්නා ණය ගිවිසුම්ගත වූ පරිදි අදාළ කාලය තුළ නියත වශයෙන් ම ගෙවීමට සිදු වේ. ණය ඇගැයීමේ දී සිදු කෙරෙනුයේ එම ණය සම්පූර්ණයෙන් හා කාලීන ව ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ ව කිසියම් තක්සේරුවක් කිරීම ය. එ නම්, ණය ශ්‍රේණියක් විසින් යම්කිසි ණය උපකරණයක හෝ ණය ගැනුම්කරුවකු ගේ ණය ආපසු ගෙවීම පිළිබඳ විශ්වසනීයත්වය හෝ අවදානම හෝ ගෙනහැර දක්වයි. ආයතන පිළිබඳ ව ද ආයතන විසින් හෝ රටවල් විසින් හෝ නිකුත් කරනු ලබන ණය උපකරණ සඳහා ද ණය ශ්‍රේණිගත කිරීම් සිදුකරනු ලබයි.

ණයකරු ගේ ව්‍යාපාරික හා මූල්‍ය තොරතුරු පදනම්කරගෙන ණය ශ්‍රේණිය තීරණය කෙරෙයි. ණය ඇගැයීම් සරල සංකේතවලින් දැක්වෙයි. මෙම සංකේත සඳහා ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර භාවිතා කරන අතර ඒවා පහසුවෙන් ආයෝජකයන්ට ග්‍රහණය කරගැනීමට හැකි වන පරිදි එක් එක් සංකේත සඳහා වෙන් වෙන් වශයෙන් වටිනාකම් පැවරීමක් ද සිදු කර ඇත. උදාහරණ ලෙස AAA, BBB හා B යන ඇගැයීම් දැක්විය හැකි ය. එ මගින් ආයෝජන අවස්ථාවක ඇති විශ්වාසය හෝ අවදානම හෝ පිළිබඳ හැඟීමක් ඉතාමත් පහසුවෙන් ඇති කර ගැනීමට ආයෝජකයන්ට ඉඩ කඩ සලසා දෙනු ලබයි. එ මෙන් ම, සමාගමක අනාගත අවදානම මනිනු ලබන්නේ එම සමාගම පිහිටා ඇති රටේ අවදානමට සාපේක්ෂව ය. ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර බිල්පත් ශ්‍රී ලංකාව තුළ ආපසු ගෙවීමේ අවදානමකින් තොර (Default Risk Free) ආයෝජන අවස්ථාවක් ලෙස සළකනු ලැබේ. ඒ නිසා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශ්‍රී ලංකාව තුළ ඉහළ ම ණය ඇගැයීමක් හිමි වේ.

ණය ගැනුම්කාර ආයතනය (එ නම්, රජය හෝ මූල්‍ය ආයතනය) සේවා ගාස්තුවක් ගෙවා තමන් විසින් නිකුත් කරනු ලබන සුරැකුම් සඳහා ණය ශ්‍රේණිගත ආයතනය හෝ ආයතන හෝ වෙතින් ණය ශ්‍රේණියක් ලබාගනියි. ගිවිසුම්ගත කාලය තුළ ණය ගැනුම්කරු ගේ (එ නම්, සුරැකුම් විකුණුම්කරු ගේ) මූල්‍ය සහ ව්‍යාපාරික තොරතුරු වෙනස්වීම මත ණය ශ්‍රේණිය ද ඉහළ පහළ ලෙස විචලනය වනු ඇත. ණය ශ්‍රේණිය ප්‍රසිද්ධ කිරීම හෝ නො කිරීම ණය ගැනුම්කරු ගේ මනාපය පරිදි කළ හැකිය. නමුත් වෙළෙඳපොළින් ණය ලබාගැනීමේ දී ණය ශ්‍රේණිය පිළිබඳ ව ආයෝජකයන් විමසන බැවින් එය ප්‍රසිද්ධ කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් ව පවතී. ණය ශ්‍රේණිය පිළිබඳ ව විමසා බලා එම සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ නො ගැනීමට ආයෝජකයෝ තීරණය කරති.

**විවිධ ණය ඇගැයීම්**

- දේශීය ණය ඇගැයීම් - මෙහි දී සළකා බලන රටෙහි අභ්‍යන්තර අවදානම සැළකිල්ලට ගනු නො ලබන අතර, එය ජාත්‍යන්තර ඇගැයීම් සඳහා භාවිතා කළ නොහැක.

- ජාත්‍යන්තර ණය ඇගැයීම් - විදේශ මුදල් සම්බන්ධයෙන් රටේ අවදානම සහ විනිමය අනුපාතය යන දෙක ම සැළකිල්ලට ගනු ලබන අතර, දේශීය මුදල් සම්බන්ධයෙන් රටෙහි අවදානම පමණක් සැළකිල්ලට භාජනය කරයි.

- නිකුතු ඇගැයීම් - කිසියම් ණය නිකුතුවක් ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ අදහසක් ලබා දීම මෙහි දී සිදු වේ.

- සමාගම් වර්ගීකරණය - සමාගමක ණය ආපසු ගෙවීමේ හැකියාව (උපකල්පන මත පදනම් ව) පිළිබිඹු කරයි.

**ණය ඇගැයීම් ලබාගත හැකි විවිධ අවස්ථා**

1. ව්‍යුහාත්මක ණය සුරැකුම් (Structured Credit Securities)

2. වරණීය කොටස් (Preference Shares)

3. වාණිජ පත්‍ර (Commercial Papers)

4. ණයකර (Debenture/ Bonds)

5. ස්ථාවර තැන්පතු (Fixed Deposits)

6. මූල්‍ය ඇපකර (Financial Guarantees)

7. සමාගම් (Business Entities)

8. රක්ෂණ වන්දි ගෙවීමේ හැකියාව (Insurance Claim Paying Ability)

9. ව්‍යාපෘති මූල්‍යකරණය (Project Financing)

10. තැන්පතු සහතික (Certificate of Deposits)

11. උකස් මත පදනම් වූ සුරැකුම් (Collateralized Loan/ Bond Obligations)

12. නගර සභා සහ පළාත් සභා (Local Government Bodies)

13. රටවල් (Sovereigns)

**ණය ශ්‍රේණි භාවිතය**

ආයෝජකයන්, ණය දෙන්නන්, ආයෝජන බැංකු, තැරැව්කාර ආයතන සහ රජයන් විසින් විවිධ ණය උපකරණ සඳහා ණය ඇගැයීම් භාවිතා කරනු ලබයි. ආයෝජන විකල්ප ප්‍රමාණය වැඩිකිරීම, ස්වාධීනතාව ඉහළ නැංවීම, සාපේක්ෂ ණය අවදානම අඩු කිරීම තුළින් සාමාන්‍යයෙන් ණය ගැනුම්කරුවන් ගේ සහ ණය දෙන්නන් ගේ පිරිවැය අඩුකර, ගනුදෙනු කාර්යක්ෂමතාව ඉහළ නංවා ආයෝජන කාර්යය ලාභදායී සහ කාර්යක්ෂම කිරීමට ණය ශ්‍රේණි දායක වේ.

ණයකර නිකුත් කරන්නෝ ඔවුන් ගේ ණය හැකියාව තහවුරු කිරීම සඳහා ස්වාධීන ණය ඇගැයීම් මත යැපෙති. බොහෝ අවස්ථාවල දී සැළකිය යුතු ණයකර නිකුතුවක් සිදුවන විට එය සාර්ථක නිකුතුවක් වීම සඳහා අඩු තරමින් එක් ණය ඇගැයීමක් හෝ පිළිගත් ණය ඇගැයීම් ආයතනයකින් ලබා ගත යුතු ය. බොහෝ ආයතන ණයකර නිකුත් කිරීමේ දී අඩු තරමින් ණය ඇගැයීම් තුනක්වත් ලබා ගැනීමට පෙළඹී සිටී.

රාජ්‍ය නියාමකයෝ ද තම නියාමන කටයුතුවල දී ණය ශ්‍රේණි භාවිතා කරති. උදාහරණයක් ලෙස, බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් කමිටුවේ (Basel Committee) බාසල් II සම්මුතියට අනුව, බැංකුවලට අනුමත ආයතනවලින් ණය ශ්‍රේණි ලබාගැනීමට යොමුකරවීම සඳහා බැංකු නියාමන ආයතනවලට ඉඩ කඩ සළසා දී ඇත. එ මෙන් ම, ඇමෙරිකා එක්සත් ජනපදයේ සුරැකුම් හා විනිමය කොමිසම විසින් ආයෝජන බැංකු හා තැරැව්කරුවන්ට ද ණය ශ්‍රේණි ලබාගැනීම සඳහා අවසර ලබා දී ඇත. රක්ෂණ සමාගම් ද ඒවායේ සංචිතවල ශක්තිමත් බව තහවුරු කර ගැනීම සඳහා ණය ඇගැයීම් භාවිතා කරයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ මේ වන විට රක්ෂණ සමාගම් 5 ක් Fitch Rating සහ RAM Rating ආයතනවලින් ණය ශ්‍රේණි ලබාගෙන ඇත. බැංකු සඳහා ණය ඇගැයීම් ලබා ගැනීමේ දී සළකා බැලිය යුතු මූලික අවශ්‍යතා ද බාසල් II මාර්ගෝපදේශ තුළින් හඳුන්වා දී ඇත. විසම මූලිකත්වය, ස්වාධීනතාව සහ පාරදෘශ්‍ය බව ඒ අතරින් වැදගත් වේ.

## ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ඉතිහාසයෙන් බිඳක්

ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ආරම්භය අවුරුදු සියයකටත් වඩා ඈත ඉතිහාසයකට දිව යයි. මුල්වරට ණය ඇගැයීමක් පිළිබඳ මූල්‍ය විශ්ලේෂණයක් සිදුකරනු ලැබුවේ 1909 දී ජෝන් මූඩී (John Moody) විසිනි. දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා ඒ ආශ්‍රිත සමාගම්වලට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කිරීමට දුම්රිය මාර්ග ණය මුල්වරට වෙළෙඳපොළට නිකුත් කරනු ලැබීය. මුල් ම ණය ඇගැයීම් වාර්තා ඉදිරිපත් කරනු ලැබුවේ එම දුම්රිය මාර්ග සුරැකුම්වල ණය ගෙවීමේ හැකියාව තහවුරු කිරීම සඳහා ය. එම කාර්යය කළ ආයතනය මූඩීස් ඉන්වෙස්ටර්ස් සර්විස් (Moodyzs Investors Service) නමින් හැඳින්විණි.

එයින් වසර පහකට පසුව එනම් 1916 දී Standard and Poor's සමාගම ද තම ණය ශ්‍රේණි ආයෝජකයන්ට විකිණීම ආරම්භ කළේ ය. 1924 දී, Fitch Rating ණය වර්ගීකරණ ආයතනය ද අනෙක් ආයතනයන්ට සමාන ව ණය ඇගැයීම් කාර්යය ආරම්භ කරනු ලැබී ය. බැංකුවල අවදානම පිළිබඳ ඇගැයීම සඳහා 1930 දී ෆෙඩරල් නියාමකයෝ ද මුල්වරට මෙම ණය ශ්‍රේණිගත ආයතනවල සහාය ලබා ගත්හ. දෙවන ලෝක යුද්ධයෙන් පසුව මෙම ආයතනවල වැදගත්කම ක්‍රමයෙන් පිරිහුන ද 1970 දශකයේ ඇති වූ ආර්ථික අවපාත තත්ත්වය සමග මේවායේ වැදගත්කම යලි යලිත් ඉස්මතුවන්නට පටන් ගැනිණ.

**වගුව 1: බැඳුම්කර වැනි ණය සුරැකුම් සඳහා ප්‍රධාන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තුන විසින් ලබා දී ඇති ශ්‍රේණි**

| ශ්‍රේණිය | මූඩීස් | | ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර් | | ෆිච් | |
|---|---|---|---|---|---|---|
| | දිගු කාලීන | කෙටි කාලීන | දිගු කාලීන | කෙටි කාලීන | දිගු කාලීන | කෙටි කාලීන |
| ප්‍රමුඛ | Aaa | P-1 | AAA | A-1+ | AAA | F1+ |
| ඉහළ | Aa1 | | AA+ | | AA+ | |
| | Aa2 | | AA | | AA | |
| | Aa3 | | AA- | | AA- | |
| ඉහළ-මධ්‍යම | A1 | | A+ | A-1 | A+ | F1 |
| | A2 | | A | | A | |
| පහළ-මධ්‍යම | A3 | P-2 | A- | A-2 | A- | F2 |
| | Baa1 | | BBB+ | | BBB+ | |
| සමපේක්ෂක | Baa2 | P-3 | BBB | A-3 | BBB | F3 |
| | Baa3 | | BBB- | | BBB- | |
| ඉහළ සමපේක්ෂක | Ba1 | ප්‍රමුඛ නොවන | BB+ | B | BB+ | B |
| | Ba2 | | BB | | BB | |
| | Ba3 | | BB- | | BB- | |
| | Ba1 | | B+ | | B+ | |
| | Ba2 | | B | | B | |
| | Ba3 | | B- | | B- | |
| සැළකිය යුතු මට්ටමේ අවදානම් | Caa1 | | CCC+ | C | CCC | C |
| අතිශයින් ම සමපේක්ෂක | Caa2 | | CCC | | | |
| | Caa3 | | CCC- | | | |
| ණය පැහැර හරින (ආපසු අය කරගැනීමේ හැකියාව ඉතා අඩු) | Ca | | CC | | | |
| | C | | C | | | |
| ණය පැහැර හරින | / | | D | / | DDD | / |
| | | | | | DD | |
| | | | | | D | |

ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන තම ඇගැයීම් වාර්තා විකුණා මුදල් උපයති. ඔවුන් වැඩි වැඩියෙන් මුදල් උපයන්නේ ආර්ථික අර්බුද පවත්නා කාලවල දී ය. ආර්ථිකය යහපත් ව පවතින විට, ආර්ථිකය හොඳින් වර්ධනය වන විට ඔවුහු අපහසුතාවන්ට මුහුණ පාති. එ බඳු කාල වකවානුවල දී අවදානම ඉතාමත් අඩු අතර ඕනෑ තරම් ආයෝජන අවස්ථා සොයාගැනීම ආයෝජකයන්ට පහසු කාර්යයකි. එ විට, ශ්‍රේණිගත කිරීමේ ආයතනවල මග පෙන්වීම් අදාළ නො වන තත්ත්වයට පත්වෙයි. එ බැවින්, ශ්‍රේණිගත කිරීම් ආයතනවල සරු කාලය පවතින්නේ ආර්ථික චක්‍රවලට පරස්පර ආකාරයෙනි. 1970 ට පෙර ශ්‍රේණිගත කිරීම් ආයතනවල වාර්තා ආයෝජකයන් විසින් මිල දී ගැනිනි. එහෙත් එයින් පසු ව, ලෝක ආර්ථිකය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ බැවින් ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට ආදායම් ඉපැයීමට තිබූ අවස්ථා සීමා වන්නට විය. කෙ සේ වෙතත්, ඒ වන විට ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් නිරීක්ෂණය කළ ඉතා වැදගත් ව්‍යාපාරික සංසිද්ධියක් විය. ඔවුන් නිරීක්ෂණය කළේ ආර්ථිකය යහපත් වුව ද අයහපත් වුව ද සුරැකුම් නිකුත් කරන්නන් හොඳ ඇගැයීමක් පිළිබඳ ව සැළකිලිමත් වන බව ය. එ බැවින්, 1970 දශකයේ මුල් භාගයේ සිට තමන් ගේ සේවාවට අය කරන ක්‍රමය වෙනස් කිරීමට ණය ශ්‍රේණිගත කරන්නෝ පෙළඹුනහ. ඒ අනුව, ආයෝජකයන් වෙත නොමිලේ වාර්තා සැපයීමත් සුරැකුම් නිකුත් කරන්නන්ගෙන් ගාස්තුවක් අයකිරීමත් ඔවුහු ඇරඹූහ. මේ වන විට එම ක්‍රමය හොඳින් ස්ථාපිත ව තිබේ.

**විවිධ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන**

ඉහතින් දැක් වූ ප්‍රධාන ණය ඇගැයීම් ආයතන තුනට අමතරව ලෝකයේ බොහෝ රටවල ණය ඇගැයීම් ආයතන පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වන්නේ ෆිච් රේටින් ලංකා ලිමිටඩ්, ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් සහ ICRA ලංකා ලිමිටඩ් යන ඒවා ය. මේවා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසම් සභාවේ අධීක්ෂණයට යටත් ව ක්‍රියාත්මක වෙයි.

ශ්‍රී ලංකාව ද ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළින් ණය ලබා ගැනීම පිණිස ණය ශ්‍රේණි ලබාගෙන ඇති අතර, ෆිච් රේටින් ආයතනයෙන් B+ (ස්ථායි) ද ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර් ආයතනයෙන් B (ධනාත්මක) ද ලැබී ඇත.


**ණය ශ්‍රේණිගත කිරීමේ මූල්‍ය ප්‍රතිලාභ**

ණය දෙන්නන් සහ ආයෝජකයන් යන දෙපාර්ශ්වයට ම ණය ශ්‍රේණිගත කිරීම්වලින් විවිධ වූ මූල්‍ය වාසි සැළසෙයි.

**ණය දෙන්නන් සඳහා ඇති වාසි**

- ණය දෙන්නන්ට තම මූල්‍යකරණ අලෙවිකිරීම සඳහා කරනු ලබන වියදම් සහ ප්‍රාග්ධන පිරිවැය ප්‍රතිශතය මෙ මගින් අවම කරගත හැකිය. ණය ඇගැයීම් තුළින් ඒ ඒ ආයතනයේ අවදානම පිළිබඳ පාරදෘශ්‍ය චිත්‍රයක් ගෙන හැර දක්වයි. එ බැවින්, ආයෝජකයන්ට තම ආයෝජන සිදුකරන ආයතනය පිළිබඳ ව නිසි අවබෝධයක් ඇති කරගැනීමටත් ඒ

**රූප සටහන 1: ණය ශ්‍රේණිය අනුව වැඩියෙන් ගෙවිය යුතු ප්‍රතිශතය**




**මූලාශ්‍ර- ෆිච් රේටින් ලංකා ලිමිටඩ්**

ඔස්සේ කිසියම් විශ්වාසයක් ගොඩනඟා ගැනීමටත් අවස්ථාව සැළසෙයි. ආයෝජකයන්ට ගෙවන පොලිය සාපේක්ෂ ලෙස අවම කර ගැනීමට හැකිවීම මෙහි ආර්ථික වාසිය වශයෙන් පෙන්වා දිය හැකි ය. එ සේ ම, පොදු ප්‍රාග්ධන වෙළෙඳපොළට කෙලින් ම ප්‍රවිෂ්ට වීමට ණය ඇගැයීමක් උපකාරීවන නිසා ද ණය සඳහා ගෙවිය යුතු පොලී අනුපාතය අවම කර ගත හැකිය. උදාහරණයක් ලෙස ඇමෙරිකානු වෙළෙඳපොළේ ණය ඇගැයීම් හා ණය පොලී අනුපාතය (Bond Yield) අතර ඇති සම්බන්ධය 1 වන රූප සටහන මගින් දැක්වේ. (1 වන රූප සටහනට අනුව, අමෙරිකානු වෙළෙදපොලේ AAA ඇගැයීමක් ලැබූ ණයකරවලට රජයේ භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතයට වඩා 0.65% ක ඉහළ පොලී ප්‍රතිශතයක් ගෙවීමට සිදුවේ. උදාහරණයක් වශයෙන්, රජයේ භාණ්ඩාගාර බිල්පතක පොලී අනුපාතය 10% ක් නම් AAA ඇගැයීමක් ලැබූ ණයකරයක පොලී අනුපාතය 10.65% ක් වේ. එ මෙන් ම, B ඇගැයීමක් ලැබූ ණයකරයක පොලී අනුපාතය 14.45% ක් වේ.)

- සාම්ප්‍රදායික ණය නිකුතුවල දී බොහෝවිට බැංකු ඇපකරයක් (Bank Guarantee) ලබා ගැනීමට සිදු වේ. ඒ සඳහා වාර්ෂිකව කිසියම් වියදමක් දැරීමට සිදුවනු ඇත. නමුත් බැංකු ඇපකර වෙනුවට ණය ශ්‍රේණිගත කිරීමක් මත පදනම් ව ආයෝජනය සිදුකිරීමට පෙළෙඹෙන ආයෝජකයින් නිසා එසේ ගෙවීමට සිදුවන වියදම අවම කර ගත හැක.

- ව්‍යාපාර සඳහා ණය ප්‍රාග්ධනය ලබාගැනීමට ඇති මූලාශ්‍ර වපසරිය වැඩිකර ගැනීමට හැකිවීම තවත් වාසියකි. බැංකු ණය මත පමණක් යැපීම වලක්වා පුළුල් ලෙස ව්‍යාප්ත වූ ණය මූලාශ්‍ර වෙත යොමුවීමට මෙ මඟින් වැඩි ඉඩකඩක් හිමි වේ. එ නම්, දිගුකාලීන ණය මූලාශ්‍ර වෙත යොමුවීමට මෙන් ම කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත බැඳුම්කර තුළින් ද ණය ලබාගැනීමට අවශ්‍ය පහසුව ණය ඇගැයීම්වලින් සළසයි.

- ණය ඇගැයීමකින් පිළිබිඹු කරනුයේ ව්‍යාපාරයක හෝ ආයතනයක හෝ ණය ගෙවීමේ හැකියාවයි. එම යහපත් තත්ත්වයන් විවිධ වෘත්තිය මාර්ග තුළින් ව්‍යාප්ත වීම නිසා ලොව පුරා විසිර සිටින ආයෝජකයන්ට හා ගනුදෙනුකරුවන්ට තම ආයතනය පිළිබඳව කිසියම් විශ්ලේෂණයක් ලබා ගත හැකිය. ආයතනයට නව ආයෝජකයන් එකතුවීමට මෙන් ම පවත්නා ආයෝජන සම්බන්ධතා පුළුල් වීමට අවශ්‍ය පහසුකම ද එයින් සැළසෙයි.

- ව්‍යාපාරයක අනාගත ණය ගෙවීමේ හැකියාව විශ්ලේෂණය කිරීම තුළින් ව්‍යාපාරය මුහුණ දිය හැකි අවදානම් පිළිබඳ තහවුරුවක් ලැබෙන අතර, එම අවදානම් සාධක අවම කරගත හැකි උපක්‍රම පිළිබඳ උපදේශනයක් ලබාගැනීමට ද ණය ඇගැයීම් ප්‍රයෝජනවත් වේ.

**ආයෝජකයන් සඳහා ඇති වාසි**

- ආයෝජන අවස්ථාවක පවත්නා අවදානම පිළිබඳ පහසුවෙන් හා සරල ව දැනගැනීම සඳහා ඇති හොඳ ම ක්‍රමය ණය ශ්‍රේණිගත කිරීමක් තුළින් සැළසෙයි.

- කිසියම් ණය ශ්‍රේණිගත කිරීමකට අදාළ ඇගැයීම් වාර්තාව සහ සමීක්ෂණ දත්ත ආයෝජකයන්ට නොමිලේ ලබාගත හැකි ය. එ බැවින්, ආයෝජන අවස්ථා පිළිබඳ ව ඇති අවදානම සම්බන්ධයෙන් සොයා බැලීමට ගතවන කාලය සහ පිරිවැය අඩු වේ.

- කල්බදු සුරැකුම්කරණය (Lease Securitization) වැනි ව්‍යුහගත මූල්‍යකරණ අවස්ථාවල අවදානම ගැන දැනගැනීමට ණය ඇගැයීම් බෙහෙවින් උපකාරී වේ. මෙ වැනි විශේෂිත වූ ණය නිකුතුවල අවදානම තක්සේරු කරගැනීම සඳහා ආයෝජකයන්ට ඉඩකඩක් සළසාදීම ණය ඇගැයීම් කාර්යයේ තවත් ප්‍රතිලාභයකි.

- ආයෝජන අවස්ථා පිළිබඳ ව ඇති අවදානම පහසුවෙන් අවබෝධකර ගැනීමට ඇති ඉඩකඩ ණය ශ්‍රේණිගත කිරීම තුළින් ලැබෙන අතර, එය වැඩි ආයෝජකයන් පිරිසක් ණය වෙළෙඳපොළට එකතු කරගැනීම සඳහා උත්ප්‍රේරකයක් වේ. මෙය ද්විතීයික වෙළෙඳපොළේ ද්‍රවශීලතාව ඉහළ නැංවීමට ද හේතු පාදක වේ.

- විවිධාකාරයේ ණය සුරැකුම්පත් මගින් ලැබෙන ප්‍රතිලාභ ඒවායේ අවදානම සමග සංසන්දනය කිරීමට හැකිවීම ණය ඇගැයීම්වල තවත් ප්‍රතිලාභයකි.

- වෘත්තීමය අරමුදල් කළමණාකරුවන්ට ආයෝජන කලඹවල ඇති ණය සුරැකුම්වල වෙළෙඳ අගය තක්සේරු කළ හැකිය. එය ආයෝජන කළඹේ ද්‍රවශීලතාව පෙන්නුම් කරන්නකි.

**ණය ශ්‍රේණිගත කිරීම් සෑම විටෙක ම සාධාරණ ද?**

මෙම ලිපියෙන් මේ දක්වා සාකච්ඡාවට ලක් කරනු ලැබුවේ ණය ඇගැයීම්වල ස්වභාවය, ඒවායේ කාර්යභාරය සහ ආර්ථික වැදගත්කම පිළිබඳ ව ය. ආර්ථික වශයෙන් කො පමණ වැදගත් සේවයක් ඉටු වුන ද වර්තමාන ණය ඇගැයීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් පවත්නා විවේචන ද සුලු පටු නො වේ. පසුගිය කාලයේ දී පැන නැගුණු ලෝක ආර්ථික අර්බුදය සහ වර්තමානයේ පවත්නා ණය අර්බුද පිළිබඳ ව විමසා බැලීමේ දී ණය ඇගැයීම් ක්‍රියාදාමය යම් ආකාරයක නැවත විමසීමකට ලක් කිරීමේ වැදගත්කම ඉස්මතු ව එයි. තත්කාලීන ආර්ථික හා මූල්‍ය අර්බුදවලට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ ද පවත්නා ණය ඇගැයීම් ක්‍රියාදාමය ම බවට ද අදහස් පළ වී ඇත.

ගෝලීය මූල්‍ය අර්බුදයට පාදක වූ උප ප්‍රමුඛ උකස් ණය වෙළෙඳපොළෙහි සියලු ම සුරැකුම් ණය ශ්‍රේණියක් සහිත ව නිකුත් කරනු ලැබූ ඒවා විය. කලින් කලට සුරැකුම්වල අවදානම අඩු වැඩි වන විට ණය ශ්‍රේණිගත ආයතන විසින් ඒවාට සරිලන ආකාරයෙන් ණය ශ්‍රේණිය වෙනස් කොට ඒ බව වෙළෙඳපොළට දැන්විය යුතු ය. නමුත්, උප ප්‍රමුඛ උකස් වෙළෙඳපොළෙහි සුරැකුම්ගත බැඳුම්කර සම්බන්ධයෙන් එවැන්නක් සිදු නො වී ය. උප ප්‍රමුඛ උකස් ණය අවදානම ඉතා ඉහළ ගිය ද ඒ මත පදනම් වූ සුරැකුම්ගත බැඳුම්කරවල ණය ශ්‍රේණිය සංශෝධනය නො කිරීම නිසා ආයෝජනයේ තත්කාලීන අවදානම පිළිබඳ ව දැනුම්වත් වීමක් ආයෝජකයන් වෙත නො තිබිණි. අවසානයේ දී වෙළෙඳපොළේ සැබෑ තත්ත්වය පිළිබඳ ව ආයෝජකයන් දැනුම්වත් වූයේ ඉතා කෙටි කාලයක් තුළ ය. එ බැවින්, එක්වර ම සුරැකුම් වෙළෙඳපොළ කඩා වැටුණි. ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් තාක්ෂණික ව පිළිගත් න්‍යාය ධර්ම මත එම ශ්‍රේණිගත කිරීමේ කාර්යය ඉටු නො කළ බවත් නොයෙකුත් දූෂණ අක්‍රමිකතා සිදු වී තිබූ බවත් පසුව හෙළිදරව් විය. ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල එම පිළිවෙත නිසා ආයෝජකයෝ මුලා වී කටයුතු කළහ. එ මෙන් ම, වත්මන් යුරෝපීය මූල්‍ය අර්බුදය සඳහා ආසන්න ම හේතුව වශයෙන් සැළකෙන්නේ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර් ආයතනය විසින් ඉතිහාසයේ ප්‍රථම වතාවට එක්සත් ජනපද රජයේ ණය ඇගැයීම AAA සිට AA+ දක්වා පහත හෙළීම බවට ද අදහසක් වෙයි.

ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යය මූඩි (Moody's), ස්ටෑන්ඩර්ඩ් සහ පුවර් (Standard) Poor's) සහ ෆිච් (Fitch) යන ඇමෙරිකා එක්සත් ජනපදය පදනම් කරගත් ආයතන තුනෙහි ඒකාධිකාරයක් මත ක්‍රියාත්මක වන බවට ද චෝදනාවක් වෙයි. සමස්ත ලෝකය ම ඔවුන් සපයන තොරතුරු මත පදනම් වී කටයුතු කරයි. මෙහි අවාසි ගණනාවක් වෙයි. ඒවායින් පළමුවැන්න වනුයේ ණය ඇගැයීම් කාර්යය මුළුමනින් ම එක් රටක කේන්ද්‍රගත වී තිබීමෙන් උද්ගත විය හැකි පක්ෂග්‍රාහී බව යි. දෙවැනි අවාසිය ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තුළ ඇමෙරිකා එක්සත් ජනපදයෙහි භූමිකාව මත ඉස්මතු වෙයි. ඇමෙරිකා එක්සත් ජනපදය යනු අද ලොව සිටින විශාලතම ණයගැතියා ය. එ බැවින්, අද මූල්‍ය වෙළෙඳපොළට වාර්තාවෙන්නේ ණය ගැතියකු විසින් කරනු ලබන ණය ඇගැයීම් ය. මෑතක දී චීනයේ ආරම්භ කොට ඇති තා-කුං (Dagong's) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් මෙම කාරණය අවධාරණයෙන් පෙන්වා දෙයි. තා-කුං ආයතනය පිහිටුවා ඇත්තේ ලොව විශාලතම ණය දෙන්නා වන මහජන චීනයේ ය. ඔවුන් ගේ අදහස වනුයේ ණය ඇගැයීම් කාර්යය ණය ගැතියාගෙන් ණය දෙන්නා වෙත ප්‍රතිස්ථාපනය විය යුතු බව ය. තව ද, වර්තමාන ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර වශයෙන් අධීක්ෂණයකට ද ලක් නොවෙයි. මෙම කරුණු විසින් වත්මන් ණය ඇගැයීම් ක්‍රියාවලිය තුළ පවත්නා දුර්වලකම් හෙළි කරයි.

වෙළෙඳපොළෙහි පවත්නා උග්‍ර තරගකාරිත්වය නිසා ද ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට මූලධර්ම මත පදනම් ව ඇගැයීම් කිරීමට ඇති ඉඩකඩ ඇහිරී ඇත. එ බැවින්, මේ වන විට එම ආයතන එදිනෙදා පැවැත්ම ගැන පමණක් සළකා කටයුතු කරන වාතාවරණයකට යොමු වී තිබේ. තව ද, ණය දෙන්නෝ වැඩි ඇගැයීමක් ලබාදෙන ආයතන වෙත වැඩි රුචියක් දක්වති. එ බැවින් වැඩි සේවා අවස්ථා සැළසෙන්නේ එ බඳු ආයතනවලට ය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ සියලු ආයතන ඉහළට නැඹුරු වූ ඇගැයීම් ලබාදීමට පෙළැඹී සිටීම ය. එ බැවින් ණය වෙළෙඳපොළෙහි පවත්නා අවදානම නියමාකාරයෙන් චිත්‍රණය නො වීම ය. එම වාතාවරණය නිසා මූල්‍ය වෙළෙඳපොළෙහි නියාමකයෝ පවා ගැටලුවලට මුහුණ පා සිටිති.

ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල ක්‍රියාදාමය සම්බන්ධයෙන් එල්ල වී ඇති චෝදනා කිහිපයක් පහතින් සංක්ෂිප්ත ව දක්වා ඇත.

- ප්‍රමාණවත් තරමින් කරුණු ඇති විට ද සමාගම්වල ණය යෝග්‍ය බව යථා පරිද්දෙන් පහත නො හෙළීම

- විශාල පරිමාණයේ සමාගම්වල ඉහළ කළමනාකාරිත්වය සමඟ ණය ඇගැයීම් ආයතනවල බලධාරීන් සබඳතා පැවැත්වීම

- එ වැනි සමාගම්වලට වාසි සහගත වන ආකාරයෙන් ණය ඇගැයීම් වාර්තා සැකසීම

- යම් යම් ණය සුරැකුම්වලට ආයෝජකයන් පෙළඹවීම උදෙසා ඒවා සම්බන්ධයෙන් අධි ඇගැයීම් ලබාදීම

- ණය ඇගැයීම් ආයතන ක්‍රියා කරන්නේ ඒවා උපයාගෙන ඇති කීර්ති නාමය මත ය. එ බැවින් එ වැනි කීර්ති නාමයක් ඇති ආයතනවලින් ම ඇගැයීම් වාර්තා ලබාගැනීමට ණය දෙන්නෝ පෙළැඹෙති. ඒ හේතුවෙන්, ආධුනික ආයතනයකට ණය ඇගැයීම් කාර්යයට පිවිසීම ඉතා අසීරු කටයුත්තකි. ප්‍රතිඵලය වී ඇත්තේ පවත්නා ශ්‍රේණිගත කිරීමේ ආයතන අතලොස්ස ඒකාධිකාරී ආකාරයෙන් කටයුතු කිරීම ය.

- වැරැදි විනිශ්චයන් මත රඳා සිට ලබාදුන් AAA වැනි අධි ඇගැයීම් පසු ව හදිසියේ පහත හෙළීම නිසා මූල්‍ය ආයතන ද්‍රවශීලතා ගැටලුවලට මුහුණපෑම

- ණය ඇගැයීම් සම්බන්ධයෙන් පවත්නා විද්වතුන් ගේ විවේචන

මූඩීස් ආයතනය විසින් මෑතක දී පෘතුගාලයේ ණය සුරැකුම් අඩු මට්ටමකින් ඇගැයීම සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම ද එහි හිටපු සභාපති ජෝස් මැනුවෙල් බරෝසෝ (Jose Manuel Barroso) ද විසින් විවේචන පළ කර ඇත.

චීනයේ ටොක්සික් නාගරික ණය සුරැකුම් (Toxic Municipal Debt) සම්බන්ධයෙන් පළ කෙරුණු මූඩිස් වාර්තාව ද විවේචනයට ලක් වී තිබේ. ඇමෙරිකානු මෙරිල් ලින්ච් බැංකුවේ (Bank of American Merill Lynch) අර්ථ ශාස්ත්‍රඥ ටිං ලූ (Ting Lu) පවසන්නේ එම ඇගැයීම සර්ව සුභවාදී එකක් බවත් ඒ සඳහා යොදාගත් ගණිතමය ආකෘතිය පිළිගත නො හැකි බවත් ය.

**කාර්යක්ෂම ණය ඇගැයීමක් වෙනුවෙන් කළ හැකි දෑ මොනවා ද?**

වර්තමානයේ පවත්නා ගෝලීය ආර්ථික හා මූල්‍ය අර්බුදවලට ණය ශ්‍රේණිගත කිරීම් ආයතනවල ක්‍රියාදාමය ද යම් පමණකට හෝ හේතු වී ඇති බව උක්ත විවේචන අනුව පිළිගැනීමට සිදු වේ. එ බැවින් ගතික හා ස්ථායි මූල්‍ය වෙළෙඳපොළක් ඇති කරගැනීම උදෙසා විධිමත්, කාර්යක්ෂම, ස්වාධීන හා පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියාකරන ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සමූහයක් බිහි කරගැනීමේ අවශ්‍යතාව දැඩි ව මතු ව තිබේ. ඒ සම්බන්ධයෙන් කළ හැකි දෑ මොනවා දැ යි විමසා බැලීම ඒ අනුව කළ යුත්තකි.

ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යය සම්බන්ධයෙන් පවත්නා අධීක්ෂණ රාමුව ශක්තිමත් කළ යුතු බවට 2009 වසරේ දී ලන්ඩන් නුවර පැවැති 20 කණ්ඩායමේ (Group of 20) සමුළුවට යෝජනා විය. එහෙත් මේ දක්වා ම ඒ සම්බන්ධයෙන් යොදා ගත හැකි සුදුසු වැඩපිළිවෙලක් සැකසී නැත. කෙ සේ වෙතත්, චීනයේ ක්‍රියාත්මක තා-කුං වැනි විකල්ප ආයතන ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යයට පිවිසෙමින් සිටියි. ණය ඇගැයීම් කාර්යය සංශෝධනය විය යුතු ආකාරය සම්බන්ධයෙන් ද ඔවුන් විසින් විවිධ වූ යෝජනා ඉදිරිපත් කර ඇත. ඔවුන ගේ අදහස වනුයේ වත්මන් ණය ඇගැයීම් රාමුව මුළුමනින් ම ජාත්‍යන්තර මට්ටමින් පිළිගත හැකි ආයතන ව්‍යුහයක් තුළ ස්ථාපිත කළ යුතු බව යි. ඒ සඳහා ගෝලීය වශයෙන් හඳුනාගත් ණය ඇගැයීම් නිර්ණායක සමුදායක් ද ගෝලීය අධීක්ෂණ ක්‍රමවේදයක් ද ගොඩනඟා ගත යුතු ය. එය වඩාත් තාත්ත්වික කරලීම සඳහා ගෝලීය වශයෙන් භාවිතා කළ හැකි නීතිමය පද්ධතියක් හඳුන්වා දිය යුතුය.

සමස්ත ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි ම ඇගැයීම් කාර්යය එක් රටකට කේන්ද්‍රගත කිරීම වෙනස් කළ යුතු ය. ණය ගැතියා කේන්ද්‍රගත කරගත් ඇගැයීම් ක්‍රියාවලිය ද වෙනසකට භාජනය කළ යුතු ය. තව ද ණය ඇගැයීම් ආයතනවල කාර්යය මණ්ඩල සඳහා ආචාර ධර්ම පද්ධතියක් ද හඳුන්වා දිය යුතු ය. විකල්ප ඇගැයීම් ආයතනවලට මූල්‍ය වෙළෙඳපොළට පිවිසීම සඳහා ඉඩ කඩක් අන්තර්ජාතික මූල්‍ය ආයතන විසින් සහ 20 කණ්ඩායම වැනි රාජ්‍ය එකමුතු සංවිධාන විසින් සකසා දිය යුතු ය. රටක් සම්බන්ධයෙන් ඇගැයීමක් ඉදිරිපත් කිරීමේ දී එහි දේශපාලනික පසුබිමට වඩා ආර්ථික පසුබිම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

ණය ශ්‍රේණිගත කිරීමේ දී එය සිදුකරන ආයතන විසින් ඒවායේ නිගමන, නිර්දේශ සහ භාවිතා කරනු ලබන තොරතුරු විස්තරාත්මක ලෙස මහජනතාවට සැපයීම සඳහා නීති සකස් විය යුතුය. එය ආයෝජකයන්ගේ දැනුම වැඩි කිරීම සඳහා ඉවහල් වේ. එ මෙන් ම, ණය ශ්‍රේණිගත ආයතන ඒවායේ ණය ඇගැයීම හා සම්බන්ධ කාර්යසාධන සංඛ්‍යා ලේඛන මහජනතාවට ඉදිරිපත් කළ යුතු අතර, ඊට අදාළ රෙගුලාසි සකස් විය යුතුය. මෙහි දී නීතිමය අවශ්‍යතා ඉටු නො කරන ආයතන සඳහා සුදුසු දඩ මුදල් ද නියම කළ යුතුය. තව ද, ණය ඇගැයීම් කිරීමේ දී සහ ඒවා යාවත්කාලීන කිරීමේ දී භාවිතා කරන මිණුම් දඬු සහ ක්‍රම වේද ඇතුළත් වර්ගීකරණ ක්‍රියාදාමය උපරිම ලෙස අනාවරණය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් විය යුතු ය. නව, සංකීර්ණ ව්‍යුහගත සුරැකුම් සඳහා වන ණය ඇගැයීමේ දී සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර ව ඒවායේ ස්වරූපය වඩාත් හොඳින් වෙළෙඳපොළට අනාවරණය වන පරිදි සිදුවිය යුතු ය.

මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමකරණයේ අත්‍යවශ්‍ය මෙවලමක් වන ණය ඇගැයීම් සහ එහි කාර්යභාරය සම්පූර්ණයෙන් ම සැකයට බඳුන් නො කළ යුතු අතර, එහි පවත්නා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ස්වභාවය කිසියම් වෙනසකට ලක් කිරීම පමණක් ම කළ යුතු ය. ඉතා හොඳින් ක්‍රියාත්මක වන ණය ඇගැයීම් ක්‍රියාවලියක් ආයෝජකයන් ගේ විශ්වාසය ඉහළ නැංවීමටත් ණය වෙළෙඳපොළේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමටත් ඉවහල් වන අතර එය ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනයටත් ආර්ථික වර්ධනයටත් විශාල වශයෙන් දායක වනු ඇත.

# කඩදාසි අවියෙන් කළ

# බර්න්හාඩ් මෙහෙයුම

**විනීතා හේරත්**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

ව්‍යාජ මුදල් නිෂ්පාදනය කරන්නෝ එම කටයුත්තේ නියැලෙන්නේත්, නියැලී ඇත්තේත් සිය කැමැත්තෙනි. ඒ ඉන් තමාට හෝ තමන් නියෝජනය කරන පාර්ශ්වයට හෝ මූල්‍යමය හෝ වෙනත් කිසියම් ප්‍රතිලාභයක් අත්වන නිසා ය. ඇමෙරිකානු නිදහස් සටන, ඇමෙරිකානු සිවිල් යුද්ධය, වියට්නාම් යුද්ධය, ඇෆ්ඝන් යුද්ධය වැනි අවස්ථාවල ව්‍යාජ මුදල් නිෂ්පාදනය කළෝ තමනට විරුද්ධ, සතුරු පාර්ශ්වයේ ආර්ථික ශක්තිය බිඳ හෙළීමට එය කළහ. එම ආර්ථික අස්ථායී කිරීමට ව්‍යාජ මුදල් මුද්‍රණය කොට එම රටවල සංසරණය සඳහා මුදාහැරියහ. පීටර් ඇල්ස්ටන්, ෆිලිප් ඇල්ස්ටන්, මේරි බටර්වත්, විල්යම් කැලෝනර්, කැත්රින් පගි, වෙස්ලි වෙබර්, අල්වෙස් ඩොස් රීස් වැනි කී නොකී සිය ගණනක විශාල පිරිසක් ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදුනේ ලාභ පර්මාර්ථයෙනි. එය ආදායම් මාර්ගයක් ලෙස සළකමිනි. ඩේවිඩ් ප්‍රාන්ස්වර්ත් හා සැමුවෙල් අප්හැම් වැන්නන් ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදී ඇත්තේ මෙම අරමුණු දෙක ම පෙරදැරි කරගෙන ය. එ නම් සතුරු පාර්ශ්වයේ ආර්ථික බලය බිඳ දැමීමේත් පහසු මාර්ගයකින් ඉතා ඉක්මනින් ලාභ ලැබීමේත් පරමාර්ථය ඇති ව ය. එහෙත් ඊට හාත්පසින් ම වෙනස් වූ අවස්ථා ද නැත්තේ නො වේ. දෙවන ලෝක සංග්‍රාමයේ දී නාසීන් විසින් ක්‍රියාත්මක කරන ලද බර්න්හාඩ් මෙහෙයුම (Operation Bernhard) එ වැන්නකි.

එම මෙහෙයුම ගැන පැවසීමට පෙර ඒ සඳහා මං සැළසූ ඒ ආකාරයේ ම තවත් මෙහෙයුමක් ගැන කරුණු දැක්විය හැකි ය. එය හඳුන්වා ඇත්තේ "ඇන්ඩ්‍රිස් මෙහෙයුම" (Operation Andreas) යන සංකේත නාමයෙනි. දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වී දින කිහිපයක් ගත වූ තැන, එ නම් 1939 සැප්තැම්බර් 18 දින ජර්මන් නාසි හමුදාවෙහි ප්‍රධානීන් කිහිප දෙනෙක් එක් ව සාකච්ඡාවක් පැවැත්වූහ. එහි සැළකිල්ලට භාජනය කරන ලද්දේ එංගලන්ත බැංකුව විසින් නිකුත් කළ පවුම් නෝට්ටු අනුකරණය කරමින් ව්‍යාජ මුදල් නිපදවීමේ රහසිගත සැලසුමක් පිළිබඳ ව ය. මුදල් මුද්‍රණය කොට ඒවා සුවිශාල ප්‍රමාණවලින් එ රටට ගලායෑමට සළස්වා ආර්ථිකය බිඳහෙළීම එම සැලසුමෙහි අරමුණ විය. ඒ සඳහා වූ මූලික අදහස ඉදිරිපත් කරන ලද්දේ නාසි හමුදාවෙහි මේජර්වරයකු ලෙස කටයුතු කළ ඇල්ෆ්‍රඩ් නවුජෝක්ස් (Alfred Naujocks) විසිනි. එම යෝජනාව මුලින් ම ඉදිරිපත් කරනු ලැබුවේ රයිච් ආරක්ෂක අංශයේ ලෙෆ්ටිනන් ජෙනරාල්වරයකු වූ රයින්හාඩ් හේඩ්‍රිච් (Reinhard Heydrich) වෙත ය. හේඩ්‍රිච් ඒ සඳහා හෙන්රික් හිම්ලර් (Heinrich Himmler) මඟින් හිට්ලර් ගේ අනුමැතිය ලබා මෙහෙයුමේ මූලික කටයුතු ආරම්භ කිරීමට පියවර ගත්තේ ය. හේඩ්‍රිච් ගේ අරමුණ වූයේ හැකි තරම් හොඳින් පවුම් නෝට්ටු අනුකරණය කරමින් මුදල් නිපදවීම නො ව කිසිදු වෙනසක් දැකිය නො හැකි ආකාරයෙන් මුදල් නිපදවීමයි. ඔහුට අනුව ඒවා අතර තිබිය යුතු එක ම වෙනස වූයේ ඔවුන් විසින් නිෂ්පාදනය කරන ලද මුදල් බ්‍රිතාන්‍ය රජයේ අනුමැතිය රහිත ඒවා වීම පමණකි.

ඇන්ඩ්‍රිස් මෙහෙයුම පියවර 4 ක් යටතේ කිරීමට සැලසුම් කොට තිබිණි.

1. නෝට්ටු මුද්‍රණය සඳහා යෝග්‍ය කඩදාසි නිෂ්පාදනය
2. මුද්‍රණ තහඩු නිෂ්පාදනය
3. එංගලන්ත බැංකුව නෝට්ටු මුද්‍රණයේ දී භාවිතා කරන අංක ක්‍රම හඳුනාගැනීම
4. ලොව පුරා නෝට්ටු බෙදා හැරීම් ජාලයක් සකස් කිරීම

මුද්‍රණ කටයුත්ත ඇරඹීමට පෙර ඒ සඳහා නොයෙකුත් ක්ෂේත්‍රවල දැනුමැති අය ගේ සහයෝගය ලබාගැනීමට නාසීන්ට සිදුවිය. එහෙත්, එය ඔවුන් බලාපොරොත්තු වූවාටත් වඩා දුෂ්කර කටයුත්තක් විය. සතුරු රටවල ආර්ථික අඩපණ කිරීමට අමතර ව විවිධ අවශ්‍යතා සඳහා අමුද්‍රව්‍ය මිල දී ගැනීමටත් අවි ආයුධ මිල දී ගැනීමටත් ඔවුනට කඩිනමින් මුදල් අවශ්‍ය විය. මෙහි දී නාසීන් මුහුණ දුන් ප්‍රධාන ම ප්‍රශ්නය වූයේ නෝට්ටු මුද්‍රණය සඳහා එංගලන්ත බැංකුව යොදා ගන්නා කඩදාසි වර්ගයෙහි නිමාව සහ සංයුතිය හඳුනා ගැනීමයි. මේ සඳහා පවුම් 5 අව්‍යාජ නෝට්ටු කැබලිවලට කපා විශේෂඥ සහාය ලබාගනිමින් රසායනාගාර මට්ටමින් නොයෙකුත්

පර්යේෂණ කළහ. එහෙත් ඉන් බලාපොරොත්තු වූ තරම් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවූයේ නැත. පර්යේෂකයන් හට එකඟවීමට හැකිවූයේ කරුණු කිහිපයක් ගැන පමණි. එතෙක් ඔවුන් අදහස් කළේ පවුම් නෝට්ටු මුද්‍රණය සඳහා එංගලන්ත බැංකුව යොදාගත් කඩදාසි නිෂ්පාදනය කර ඇත්තේ බුරුමයේ හෝ වෙනත් ආසියාතික රටවල වැවෙන පන් විශේෂයකින් බවයි. එහෙත් ඒවා නිපදවා ඇත්තේ හණ රෙදි (Linen) භාවිතයෙන් බව මේ පර්යේෂණ මඟින් හෙළිදරව් කරගැනීමට ඔවුහු සමත් වූහ. එ මෙන් ම ඒවා සාමාන්‍ය හණ රෙදි ද නොවිණි. ඒ ආකාරයේ හණ රෙදි ලබාගත හැකිවූයේ තුර්කියෙන් පමණි. ඒ අනුව තුර්කියෙන් හණ රෙදි ටොන් කිහිපයක් ගෙන්වා ගැනීමට නවුජෝක්ස් පියවර ගත්තේ ය. නමුත් එ පමණකින් ම එම අභියෝගය ජයගැනීමට ඔවුහු අසමත් වූහ. මේ පිළිබඳව වැඩිදුරටත් පරීක්ෂාකර බැලීමේ දී පවුම් නෝට්ටු මුද්‍රිත කඩදාසි වර්ගය අනෙකුත් බොහෝ වටිනා කඩදාසි වර්ග මෙන් ම අතින් නිෂ්පාදනය කෙරුණු පල්ප භාවිතයෙන් නිෂ්පාදනය කර ඇති බවක් ඔවුහු හඳුනාගත්හ. එම නිසා නාසීහු මෙම ක්‍රමය ද අත්හදා බැලීමට තීරණය කළහ. කෙ සේ වෙතත් හණ රෙදි භාවිතයෙන් නිපදවන ලද කඩදාසි අන්වීක්ෂයකින් බලන විටත් විශේෂිත පහන් ආලෝකයෙන් බලන විටත් බ්‍රිතාන්‍ය පවුම් නෝට්ටු මුද්‍රිත කඩදාසි සමඟ සාකල්‍යයෙන් ම සමාන නොවන බැව් දක්නට ලැබිණි. යළි යළිත් මේ පිළිබඳව සොයා බැලීමට දරන ලද ප්‍රයත්නවල දී බ්‍රිතාන්‍ය පවුම් නෝට්ටු මුද්‍රණය සඳහා යොදාගෙන ඇති කඩදාසි නිෂ්පාදනය සඳහා කලින් පාවිච්චියට ගන්නා ලද හණ රෙදි පිරිසිදු කොට භාවිතා කර ඇති බව හඳුනාගැනීමට නාසීහු සමත් වූහ. එම නිසා හණ රෙදි කැබලිවලට කපා විවිධ කාර්යාලවල පාවිච්චිය සඳහා යවා, නැවත ඒවා එක්රැස් කොට සෝදා පිරිසිදු කොට නැවත නැවත ද කාර්යාල අතර බෙදාහැර එක් රැස්කොට පිරිසිදු කළහ. මෙය කිහිප වාරයක් කර කඩදාසි නිෂ්පාදනය කළ විට ප්‍රතිඵලය ඉතාමත් ම සාර්ථක විය.

කඩදාසි නිෂ්පාදනය පිළිබඳ ගැටලුව මෙ සේ විසඳාගත් පසු එංගලන්ත බැංකුව නෝට්ටුවල යොදන රහස් සලකුණු සොයා ගැනීමට ඔවුහු උත්සුක වූහ. ඉතාමත් ම දුෂ්කර කටයුත්ත වූ නෝට්ටු සඳහා දිය සලකුණ යෙදීම කඩදාසි නිපද වූ ස්පෙච්තවුසෙන් (Spechthausen) කර්මාන්ත ශාලාවේ දී ම පර්යේෂකයන් 20 දෙනකු විසින් සිදු කරන ලදී. මෙම පර්යේෂක කණ්ඩායමේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළේ විල්හෙල්ම් ෆ්‍රෑන්ක් (Wilhelm Frank) ය. සියලු ම රහස් සලකුණු සොයාගැනීමෙන් පසු කඩදාසි නිෂ්පාදනයත් මුද්‍රණ තහඩු සකස් කිරීමත් එක් ව කරගෙන යා යුතු විය. මුද්‍රණ තහඩු සකස් කිරීමට ද ඉතාමත් පළපුරුදු අයෙකු ගේ සහයෝගය ලබාගත්හ. මෙම කටයුතු සඳහා පමණක් වසරකට ආසන්න කාලයක් ගත වී ඇත. අනතුරු ව පවුම් නෝට්ටුවල සඳහන් අනුක්‍රමික අංක යෙදීමේ ක්‍රමය හඳුනාගැනීම සඳහා ගණිතඥයින් ගේ සහයෝගය ලබා ගැණිනි.

මෙම කරුණු නිරවුල් කරගත් පසු නෝට්ටු මුද්‍රණය පියවර දෙකක් යටතේ සිදු කෙරිණි. අනුක්‍රමික අංක යෙදීම සිදුකළේ දෙවන පියවරේ දී ය. ඇන්ඩ්‍රිස් මෙහෙයුම යටතේ පවුම් 5, 10, 20, 50, 100 සහ 500 නෝට්ටු මුද්‍රණය කිරීමට නාසීහු සමත් වූහ. පවුම් 5 නෝට්ටුව පමණක් පියවර තුනක් යටතේ මුද්‍රණය කර ඇත. ඒ, තුන්වන පියවරේ දී එහි පහළින් වූ Five යන්න විශේෂ කළු තීන්ත වර්ගයකින් වෙන ම මුද්‍රණය කිරීමට සිදු වූ බැවිනි. නෝට්ටු මුද්‍රණ කටයුත්ත මෙ සේ කරගෙන යද්දී ඒවා භාවිතය සඳහා පිටකිරීමට පෙර නාසි රහස් ආරක්ෂක අංශය මෙහි නිමාව පිළිබඳව තවදුරටත් තක්සේරු කිරීමේ පර්යේෂණවල නිරත වූහ. එම සියුම්, තීරණාත්මක පරීක්ෂණ කරන ලද්දේ ස්විට්සර්ලන්ත බැංකුවක් හරහා ය. කටයුත්ත භාර වූ තැරැව්කරු 1941 මාර්තු මස ජර්මන් රයිච් බැංකුවෙහි ව්‍යාජ මුදල් පිළිබඳ පිරික්සුම් දෙපාර්තමේන්තුවෙහි (Reichbank - Checking Counterfeit Currency) ප්‍රධානියා ගේ ලිපියක් ද සමඟින් ව්‍යාජ පවුම් නෝට්ටු ස්විස් බැංකුවකට ඉදිරිපත් කොට ඒවා අව්‍යාජ නෝට්ටු දැයි පරීක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටියේ ය. සැබෑව නම් එම මුදල් සේ ම ලිපිය ද ව්‍යාජ එකක් වීම ය. තෙදිනකට පසු මුදල් පිළිබඳ පරීක්ෂණයෙහි ප්‍රතිඵල ලැබුණු අතර එයින් කියැවුනේ මුදල් නෝට්ටු අව්‍යාජ ඒවා බවයි. එහෙත් තැරැව්කරු එය තවදුරටත් නිරවුල් කරගැනීම සඳහා ස්විස් බැංකුව ලවා ඒවායෙහි අනුක්‍රමික අංක හා නිකුත් කළ දින ආදිය පිළිබඳ ව එංගලන්ත බැංකුවෙන් ද විමසා සිටියේ ය. එයින් ද ලද ප්‍රතිඵලය වූයේ පරීක්ෂා කරන ලද කරුණු සියල්ල නිරවද්‍ය බවයි. මෙයින් සෑහීමට පත්වූ නාසීහු තම ව්‍යාජ මුදල් සංසරණයට එක් කිරීමේ මෙහෙයුම ආරම්භ කළහ. ඇන්ඩ්‍රිස් මෙහෙයුම යටතේ මුද්‍රණය කරනු ලැබූ මුදල්වල වටිනාකම පවුම් 500,000 කි. මෙම මෙහෙයුමට සම්බන්ධකර ගනු ලැබුවේ ජර්මානු පුද්ගලයන් කිහිප දෙනෙකු පමණි. කෙ සේ වෙතත් අභ්‍යන්තර ව පැන නැගුණු නොයෙකුත් මතභේද සහ මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් පැන නැගුනු නොයෙකුත් තාක්ෂණික ගැටලු හේතුවෙන් එම ව්‍යාජ මුදල් මෙහෙයුම වැඩිදුරටත් කරගෙන යෑමට නාසීහු අසමත් වූහ. බිඳ වැටුනු එම ව්‍යාපෘතිය නැවත ඇරඹුනේ 1942 අගෝස්තු මස ය. ඒ, බර්න්හාඩ් මෙහෙයුම ලෙසිනි.

## බර්න්හාඩ් මෙහෙයුම ඇරඹෙයි

බර්න්හාඩ් කෘෘගර් (Bernhard Krüger) රහස්‍ය හමුදාවෙහි මේජර්වරයෙක් වූයේ ය. ඔහු ඊට පෙර රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ ඉංජිනේරුවෙක් ව සිටියේ ය. කෘෘගර් යටතේ කෙරුනු යුධ ව්‍යාපෘතියක් බර්න්හාඩ් මෙහෙයුම යන සංකේත නාමයෙන් හැඳින්විනි. එය හුදෙක් ම ව්‍යාජ මුදල් නිෂ්පාදන මෙහෙයුමකි. ඒ සඳහා යුදෙව් හෝ අර්ධ යුදෙව්වන් ලෙස සැලකුණු, නාසි සිර කඳවුරු තුළ ගාල්කර සිටි රටවල් 13 ක සිරකරුවන් 142 දෙනෙකු තෝරාගනු ලැබිණි. එහෙත් මෙම ව්‍යාජ මුදල් නිෂ්පාදන කටයුත්තේ නියැලුනෝ එය කළේ ස්වෙච්ඡාවෙන් නො වේ. නාසීහු බලහත්කාරයෙන් ඔවුන් ව ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදවූහ. ව්‍යාජ මුදල් නිෂ්පාදනය පිළිබඳ ඉතිහාසයේ මෙතෙක් වාර්තා වී ඇති විශාලතම මෙහෙයුම

එයයි. ඉතාම අම්හිරි කතා පුවතක් වුව ද මෙය ගැන දැනගත යුතු ම වන්නේ ද ඒ නිසා ම ය.

මුද්‍රණ කටයුත්තට සම්බන්ධ කරගත් අය අතර පෙර මුද්‍රණ කටයුතුවල යෙදුනෝ, පිටු සැකසුම් ශිල්පියෝ, පොත් බැඳුම්කරුවෝ, රසායනඥයෝ, බැංකුකරුවෝ, තාක්ෂණික ශිල්පීහු, සැලසුම්කරුවෝ, නිර්මාණකරුවෝ, ඡායාරූප ශිල්පීහු, අකුරු කැටයම් ශිල්පීහු, මැණික් ව්‍යාපාරිකයෝ, වෙනත් ව්‍යාපාරික කටයුතුවල යෙදුණු අය මෙන් ම නොයෙකුත් ක්ෂේත්‍රයන්හී නිපුණයෝ ද වූහ. ඔවුන් අතරින් හය දෙනෙක් නාසීන් ගේ අත්අඩංගුවට පත්වීමට පෙර ද මුද්‍රණ කටයුතුවල නියැලුනෝ වූහ. ස්ලෝවැකියානු වැසියකු වූ ඇඩොල්ෆ් බර්ගර් (Adolf Burger) එවැන්නෙකි. බර්න්හාඩ් මෙහෙයුමට සම්බන්ධ ව සිටි අය අතුරින් දැනට ජීවත් ව සිටින එක ම පුද්ගලයා වන්නේ ද ඔහු ය. 1917 අගෝස්තු 12 වන දින ස්ලෝවේකියාවේ වෙල්කා ලුමින්කා (Velka Lominca) ගමෙහි බර්ගර් උපත ලැබීය. ස්ලෝවැකියානු යුදෙව්වන් නාසීන් ගේ අත්අඩංගුවට පත්වීම වැළැක්වීම සඳහා ව්‍යාජ ලිපි ලේඛන සාදමින් සිටිය දී ඔහු නාසීන්ට අසුවූයේ ය. අත්අඩංගුවට පත් ඔහු සිරකරුවකු ලෙස ගෙවූ ඛේදජනක ගමන් මඟ ඔස්ට්විච් (Auschwitz), බිර්කෙනු (Birkenau), සච්සෙන්හවුසෙන් (Sachsenhausen), රෙඩ්ල්-සිප් (Redl-Zipf)හා එබන්සී කඳවුරින් (Ebensee) අවසන් විය.

දෙවන ලෝක සංග්‍රාමයේ ඉතා සුවිශේෂී කාර්යභාරයක් මෙම ව්‍යාජ මුදල් මෙහෙයුමට හිමි වී තිබිණි. එ බැවින්, සිරකරුවන් ගේ හැකියාවන්ගෙන්, ඔවුන් ගේ නිෂ්පාදන ධාරිතාවෙන් උපරිම ඵල නෙලාගනු වස් නාසීහු ව්‍යාජ මුදල් මුද්‍රණයට සම්බන්ධ සිරකරුවන්ට අනෙකුත් සිරකරුවන්ට කිසිදු ලෙසකින්වත් ලබාදීමට නොසිතූ පහසුකම් ලබාදුන්හ. පිරිසිදු ඇඳුම්, ඇඳ ඇතිරිලි, කොණ්ඩය ඉතාමත් කොටට නො කපා සිටීමේ නිදහස, ගුවන් විදුලි යන්ත්‍ර, පුවත්පත්, සිගරට්, ගෘහස්ථ ක්‍රීඩා ඒ අතර විය. එහෙත් මෙම රහසිගත කටයුත්තට සම්බන්ධ කිසිවකුට කිසිදු දිනයක පණපිටින් කඳවුරෙන් පිටතට යෑමට ඉඩ නො ලැබෙන බව ඔවුහු සියල්ලෝ ම දැන සිටියහ.

බර්න්හාඩ් මෙහෙයුමේ ව්‍යාජ මුදල් මුද්‍රණාලය පිහිටියේ සච්සෙන්හවුසෙන් සිර කඳවුරු භූමිය තුළ ම ය. එය උතුරු බර්ලීනයේ සිට කිලෝ මීටර් 22 ක දුරින් පිහිටි ඔරානියෙන්බර්ග් (Oranienburg) නගරයේ පිහිටුවා තිබිණි. මුද්‍රණාලය පිහිටුවා තිබුණේ කඳවුරෙහි 18 සහ 19 ලෙස හැඳින් වූ ඒකක තුළ ය. වොට් 1000 අධිබල විදුලි රැහැන් යොදා එය කඳවුරෙහි අනෙකුත් කොටස්වලින් වෙන්කර තිබිණි. ගොඩනැගිලි ඇතුළත සිදුවන දේ කිසිවකුටවත් දැකගත නො හැකි විය. මෙම මෙහෙයුමට සම්බන්ධ නො වූ නාසීන්ට වුව ද එය තහනම් ප්‍රදේශයක් විය. මුද්‍රණාලයෙහි රහසිගතභාවය තදින් ම ආරක්ෂා කෙරිණි. මුද්‍රණ කටයුත්තට සම්බන්ධ සිරකරුවන් අන් කිසිවෙකු ගේ හෝ ඇස ගැටීමෙන් වළකා ලනු සඳහා පියවර ගණනාවක් අනුගමනය කෙරිණි. ඔවුනට ස්නානය සඳහා ඉරිදා දිනය වෙන්කර තිබිණි. එ දිනට ඔවුන් එම ස්ථානයට යන විට කඳවුරේ අනෙකුත් බැරැක්ක සියල්ල ම වසාදැමීමට පියවර ගත්තේ ය. අනෙකුත් සිරකරුවන් ඔවුන්ගේ බැරැක්ක තුළ ම සිටිය යුතු විය. මෙම නීතිය ඉතාමත් තදින් ක්‍රියාත්මක කොට ඇති අතර මොවුන් මුද්‍රණාලයෙන් පිටස්තර කිසිවකු ගේ හෝ නෙත ගැටුන හොත් නාසීහු ඔවුන්ට වෙඩි තබා මරා දැමූහ. එ මෙන් ම මුද්‍රණාලයේ සිරකරුවන්ට ද අනෙකුත් සිරකරුවන් දකින්නට හෝ ඔවුන්ගේ හඬක් අසන්නට හෝ නො ලැබිණි. අසනීප වූ විටෙක වෛද්‍ය ප්‍රතිකාර ලබා නො දුන් අතර නියත වශයෙන් ම රෝගියාට නාසි වෙඩි පහරින් මිය යන්නට සිදු විය. මුද්‍රණාලයෙහි රෝගී වූ සිරකරුවෝ හය දෙනෙක් මෙම අවාසනාවන්ත ඉරණමට ගොදුරු වූහ.

**බර්න්හාඩ් කෲගර් ගේ මුද්‍රණ සැලසුම**

බර්න්හාඩ් කෲගර් සිය ව්‍යාජ මුදල් මෙහෙයුම පියවර කිහිපයක් යටතේ කිරීමට සැලසුම් කළේ ය.

පළමු පියවර වඩාත් දීර්ඝ සහ සංකීර්ණ වූවක් විය. මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා සුදුසු කඩදාසි වර්ගය පිළිබඳව විමසා බැලීම, කඩදාසිවල දිය සලකුණ යෙදීම, මුද්‍රණ ක්‍රියාවලියේ දී භාවිතා කරන තීන්ත වර්ගය, අංක, සංකේත, අනුක්‍රමික අංක, අත්සන් යෙදීම ආදිය පිළිබඳ තොරතුරු රැස්කිරීම මේ යටතේ සිදුවිය. දෙවන පියවරේ දී කඩදාසි නිපදවීම, මුදල් මුද්‍රණය කිරීම, තත්ත්වය අනුව ඒවා වර්ග කිරීම සහ ඒවාට පැරණි බවක් ගෙනදීම සඳහා පියවර ගැනීම ද සැලසුම් කළේ ය. තෙවන පියවරේ දී පිළිගත් බැංකු හරහා නෝට්ටුවල වලංගුභාවය කෙතෙක් දැයි විමසා බැලීමට ද අනතුරුව සංකීර්ණ එහෙත් කාර්යක්ෂම ජාලයක් මඟින් හැකි තරම් ව්‍යාජ මුදල් වෙළෙඳපොළට මුදාහැරීමට ද සැලසුම් කළේ ය.

මෙම කාලය වන විට කඩදාසි නිෂ්පාදනය කර්මාන්තශාලා මට්ටමෙන් කරන්නක් ව තිබුණි. එහෙත් බ්‍රිතාන්‍ය මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා කඩදාසි නිෂ්පාදනය කරගනු ලැබුවේ කර්මාන්තශාලා මට්ටමින් නො වේ. ඒවා ඉතාමත් ම ඉහළ මට්ටමේ නිමාවකින් යුත් වන ලෙසත් නිෂ්පාදනය සීමාසහිත වන ලෙසත් විශේෂ ක්‍රියාවලියක් යටතේ හස්ත කර්මාන්තයක් ලෙස ම කරවූහ. 1725 සිට එංගලන්ත බැංකුවේ මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා කඩදාසි සැපයුවේ ලාවස්ටෝක් (Laverstoke) ගමෙහි ජීවත් වූ පෝටල් (Portal) පවුල විසිනි. ඔවුන් විසින් කඩදාසි නිපදවීමේ දී යොදාගන්නා ලද ජලයෙහි සංයුතිය මඟින් කඩදාසියෙහි පැහැය වෙනස්වන බව සොයාගත් නාසීහු රසායන ද්‍රව්‍ය භාවිතයෙන් ජලයෙහි සංයුතිය වෙනස් කොට බ්‍රිතාන්‍ය මුදල් නිපදවන කඩදාසිවලට සාකල්‍යයෙන් ම සමාන කඩදාසි නිපදවීමට සමත් වූහ. ඒවා නිපදවීමේ දී හණ රෙදි මිශ්‍ර පල්පය මීටර් 2ක් හෝ 3ක් පළලැති ටැංකි තුළ බහාලූහ. රසායන සංයුතිය පරීක්ෂා කිරීම ඒවා තුළ දී සිදු විය. සංයෝගය නියම පදමට ආ බව සහතික කරන තුරු සෑම පැයකට වරක් ම එහි උණුසුම හා ආර්ද්‍රතාව මනිනු ලැබූහ. පදමට ආ පල්පය වර්ග මීටරයක් වූ රෙදි මතු පිට අතුරයි. ඒවා එකිනෙක මත තබා තට්ටු 20ක් වූ විට තෙත ගතිය ඉවත්

කරනු සඳහා යන්ත්‍ර මඟින් තෙරපූහ. අනතුරුව දින 4 - 6 ක් පමණ කාලයක් ඒවා වියළන යන්ත්‍රවලට දමා වියළූහ. මසකට කඩදාසි 12,000ක් පමණ මෙසේ නිපදවා ඇත. මුද්‍රණය සඳහා භාවිතා කර ඇත්තේ ෆ්‍රැන්ක්පර්ට් (Frankfort) කළු තීන්ත ය. අවශ්‍ය වූ මුද්‍රණ තහඩු බර්ලින්වල ඕගස්ට් පෙට්‍රික්ස් (August Petrick's) කර්මාන්තශාලාවෙන් ගෙන්වා ගත්හ. නෝට්ටු මුද්‍රණය සඳහා යොදාගත්තේ Victoria-Tiegel Type 4 වර්ගයේ




පවුම් 10 සැබෑ නෝට්ටුව




පවුම් 5 ව්‍යාජ නෝට්ටුව

මුද්‍රණ යන්ත්‍රයකි. නාසීහු එම යන්ත්‍රය 1942 දෙසැම්බර් මස කඳවුරට ගෙන ආහ. විදුලිය හිඟතාව හේතුවෙන් එය ක්‍රියාත්මක කරනු ලැබුවේ ඩීසල් ජෙනරේටරයක් මඟිනි. ආරම්භයේ දී එකිනෙක කඩදාසියෙහි නෝට්ටු 4ක් මුද්‍රණය කරන ලද අතර පසුව කඩදාසි පිරිමසා ගැනීමේ අදහසින් එක් එක් කඩදාසියක නෝට්ටු 8 බැගින් මුද්‍රණය කරන්නට වූහ.

මුද්‍රණ කර්තව්‍ය සඳහා අවශ්‍ය වූ පසුබිම මුලුමනින් ම සකස් කළ පසු 1943 ජනවාරි මස මහා ව්‍යාජ මුදල් මෙහෙයුම ආරම්භ කෙරිණි. මේ යටතේ පවුම් 5, 10, 20 සහ 50 නෝට්ටු මුද්‍රණය කරන ලදී. මුද්‍රණය කරන ලද නෝට්ටු බ්‍රිතාන්‍ය මුදල් මෙන් ම අතින් කපා වෙන් කෙරිණි. ඒවායෙහි සඳහන් අනුක්‍රමික අංක අව්‍යාජ නෝට්ටුවල සඳහන් ඒවා ම විය. එ මෙන් ම අනුක්‍රමික අක්ෂර, මුල් අක්ෂර, දින, අත්සන් සහ දිය සලකුණු ගණන සැබෑ නෝට්ටුවල ඒවා මෙන් ම විය. මෙ සේ මුද්‍රණය කොට කපා වෙන් කරන ලද නෝට්ටු 1000 බැගින් මිටි බඳිනු ලැබීය. ඒවා මත වටිනාකම, අනුක්‍රමික අංක ආදිය සමඟ නිෂ්පාදනය භාර සිරකරු ගේ නම ද සඳහන් කෙරිණි. එහෙත් මුද්‍රණය කරන ලද සියලු ම නෝට්ටු සංසරණයට එක් කිරීම සඳහා සුදුසු යැයි අනුමත කෙරුණේ නැත. ඒ සඳහා නෝට්ටු වර්ග කළ යුතු ව තිබිණි.

වර්ගකිරීම සඳහා නෝට්ටු පරීක්ෂාවට අංශයක් ද පිහිටුවා තිබිණි. එම වැඩෙහි නිරත වූ සිරකරුවෝ බොහෝ දෙනෙක් ඊට පෙර බැංකුකරුවෝ ව සිටි අය වූහ. ඔවුහු පවුම් නෝට්ටුවල වූ සියලු ම රහස් සංකේත, සලකුණු පිළිබඳ ව දැන සිටියහ. නෝට්ටු පරීක්ෂාව සඳහා ඔවුනට අති දීප්ත ආලෝක පහන් ලබා දී තිබිණි. මුදල් වර්ග කරන්නන් ගේ ප්‍රධානියා වූයේ ඔස්කාර් ස්කාලා (Oskar Skala) නමැත්තෙකි. ඔහු මෙම කටයුත්ත ඉතා ප්‍රවේශම් සහිත ව මෙහෙයවූයේ ය. මන්ද, ඉතා සුළු ප්‍රමාදයකින්, අත්වැරදීමකින් සියල්ල කනපිට හැරීමට ඉඩකඩ තිබුණු බැවිනි. තේරීම් අංශයේ එක් එක් සිරකරුවකු විසින් දිනකට නෝට්ටු 300ක් වර්ග කළ යුතු විය. සරල කටයුත්තක් මෙන් පෙනුන ද එය ඉතා වෙහෙසකර කටයුත්තක් විය. සමස්ත මුද්‍රණ ක්‍රියාවලියේ එකිනෙකාට පැවරුණු කටයුතු සියල්ල ම කොතෙක් දුෂ්කර වුව ද යම් තරමක කාලයක් සඳහා හෝ තම ජීවිත රැකෙන්නේ මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත බැව් සිරකරුවෝ වටහාගෙන සිටියහ. එ මෙන් ම එම රහසිගත කටයුත්තේ නිමාවත් සමඟ ම ස්ථිර වශයෙන් ම තම ජීවිත ද එම රහසත් සමඟ ම වැළලී යන බැව් ද ඔවුහු දැන සිටියහ.

නෝට්ටු සියල්ල ඉතාමත් විධිමත් ව සියුම් ආකාරයෙන් තත්ත්ව පරීක්ෂාවට ලක් කොට ඒවා වර්ග 4කට වෙන්කරනු ලැබීය.

**1.** කිසිදු දෝෂයක් රහිත නෝට්ටු - පළමු පංතිය යටතට ගැණුනු, කිසිදු දෝෂයක් රහිත නෝට්ටු විදේශීය රටවල සිටි ජර්මන් ඔත්තුකරුවන් හරහා විවිධ මිල දී ගැනීම් සඳහා යෙදවීය. එම නෝට්ටු කොපමණ ඉහළ මට්ටමේ නිමාවකින් තිබිණි ද යත් කිසිදු අවදානමකින් තොර ව ඒවා බ්‍රිතාන්‍යයේ දී පවා ගනුදෙනු සඳහා යෙදවිය හැකි විය.

**2.** මුදල් නෝට්ටු පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත අයෙකුට පමණක් පෙනිය හැකි ඉතාමත් ම සුළු දෝෂ සහිත නෝට්ටු - යුද්ධයට සම්බන්ධ නොවූ මැදහත් රටවලින් මිල දී ගැනීම් සඳහා ද මැදහත් රටවල සිටින නියෝජිතයන්ට ගෙවීම සඳහා ද භාවිතයට ගැණිනි.

**3.** තරමක් දෝෂ සහිත නෝට්ටු - ගුවන් මඟින් බ්‍රිතාන්‍යයට හෙළීමෙන් බ්‍රිතාන්‍ය වැසියන් අතරට යැමට මඟ පාදා ඔවුන් ලවා එම මුදල් වියදම් කරවීමෙන් බ්‍රිතාන්‍ය ආර්ථිකය අස්ථායී කිරීම නාසීන් ගේ අරමුණ විය. එහෙත් මේ උපාය මුලුමනින් ම මේ ආකාරයෙන් ම ක්‍රියාවට නැංවීමට නොහැකි විය. ඊට හේතුව වූයේ මේ සඳහා යොදාගැනීමට ප්‍රමාණවත් ගුවන් යානා සංඛ්‍යාවක් ඒ වන විට ඔවුන් සතු නො වීම ය.

4. දෝෂ රැසක් සහිත නෝට්ටු - නැවත කඩදාසි සෑදීමට අවශ්‍ය පල්ප සෑදීම සඳහා යොදා ගැණිනි.



බ්‍රිටැනියා

එයින් පසු ව කළ යුතු වූයේ භාවිතා කළ ඒවා ලෙසින් පෙන්වීම සඳහා නෝට්ටුවලට පැරැණි ස්වරූපයක් ලබාදීම ය. ඒ වෙනුවෙන් ද සිරකරුවන් පිරිසක් යොදවා සිටියහ. මොවුනට පැවරී තිබුණේ එකිනෙකට වෙනස් කටයුතු ගණනාවකි. ඇතැමෙක් නෝට්ටුවල අලුත් මැදුනු ගතිය ඉවත් කිරීමටත් මඳක් කිලුටු ගතිය පෙන්වීමටත් ඒවා තරමක් පොඩි කළහ. නැවත යථා තත්ත්වයට පත්වන තුරු පිරිමැද්දහ. තවත් ඇතැමෙක් ඒවා පසුම්බිවලට දැමිය හැකි වන ආකාරයෙන් රෝල් කළහ. තවෙකෙක් ඒවා යමකට අමුණා තිබූ ආකාරයක් පෙන්වීමට ඒවා සිදුරු කළහ. තවත් ඇතැමෙක් බැංකු අයකැමියන් කරන්නාක් මෙන් නෝට්ටු මතුපිට ඉංග්‍රීසි වචන හෝ ඉලක්කම් හෝ ලිවූහ. නෝට්ටු මිටි මත එහි සඳහන් ගණන ලියා ඇති සේ අඟවන සටහන් තැබූහ.

ඒ කාලයේ දී බ්‍රිතාන්‍ය පවුම් නෝට්ටුව සෙන්ටි මීටර් 13 x 21 තරම් විශාල එකකි. එම නිසා ඒවා මුදල් පසුම්බිවලට දැමීමේ හැකියාවක් නො වී ය. මුදල් නෝට්ටු ආරක්ෂිත ව තබා ගැනීම සඳහා ඒවා රෝල් කර කටුවක් ගැසීම සිදු වූයේ එ බැවිනි. මේ නිසා භාවිතයේ පැවති නෝට්ටුවල සිදුරු රැසක් තිබෙනු දක්නට ලැබිණි. පරණ ඒවා ලෙස හැඟවෙන සේ නාසීන් විසින් මුද්‍රණය කරවන ලද ව්‍යාජ පවුම් නෝට්ටු සිදුරු කිරීමට සිරකරුවන් කිහිප දෙනෙක් යොදවා සිටියේ ඒ නිසා ය. ඔවුනට පැවරුණු එක ම කටයුත්ත වූයේ ද එයයි. බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුම් නෝට්ටුවල හෙල්ලක් හා ඔලිව් අත්තක් ගත් කාන්තා රුවක් මුද්‍රණය කර තිබිණි. මෙම රුව හඳුන්වන ලද්දේ බ්‍රිටැනියා (Britannia) යනුවෙනි. ඉංග්‍රීසි ජාතිකයෝ කිසි විටෙක එම රූපය සිදුරුවන ලෙස කටු ගැසීමෙන් වැළකී සිටියහ. එක් සිරකරුවෙක් සෑම විටෙක ම බ්‍රිටැනියා රූපය සිදුරු කළේ ය. එ මඟින් ව්‍යාජ මුදල් ව්‍යාපෘතිය පිළිබඳ ව කඳවුරෙන් බැහැරට පණිවුඩ යැවීමට ඔහු උත්සාහ කළේ ය. එහෙත් එම ප්‍රයත්නය ද සාර්ථක වූයේ නැත.

මුද්‍රණය කරන ලද නෝට්ටු ලේඛනගත කිරීමේ වැඩපිළිවෙලක් ද විය. මෙහි වැඩ පරීක්ෂක වූයේ ද ඔස්කාර් ස්කාලා ම ය. නාසි ආරක්ෂක හමුදාවට ඉදිරිපත් කිරීමට සෑදු ලේඛනයට අමතර ව ඉතාමත් ම රහසිගත ව, දැඩි අවදානමකට මුහුණ දෙමින් ව්‍යාජ මුදල් නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳව තමා ගේ ම වූ ලේඛනයක් ද තබාගැනීමට ද ඔහු ක්‍රියා කළේ ය. නාසීන් විසින් සිදුකරන ලද සුවිසල් ව්‍යාජ මුදල් මෙහෙයුම පිළිබඳ ලොවට සවිස්තරාත්මක තොරතුරු හෙළි වූයේ ඔහු ගේ එම වාර්තාවලිනි. 1943 අවසන් වන විට මසකට මුදල් නෝට්ටු මිලියනයක් පමණ මුද්‍රණය කිරීමට නාසීන් ක්‍රියා කර ඇත. 1945 සච්සෙන්හවුසෙන් සිරකඳවුර ඉවත් කරන අවස්ථාව වන විට එහි මුද්‍රණාලයේ පවුම් මිලියන 134.6ක් වටිනා නෝට්ටු මුද්‍රණය කර තිබිණි. ඔස්කාර් ස්කාලා ගේ වාර්තාවට අනුව මුද්‍රණය කරන ලද නෝට්ටුවලින් සියයට 7.5ක් පමණ (එ නම්, නෝට්ටු 671,620ක්) කිසිදු දෝෂයක් රහිත පළමු පංතියේ නෝට්ටු විය. නාසීන් ගේ ව්‍යාජ මුදල් නෝට්ටු මෙහෙයුම් පිළිබඳ ව 1939 වන විට ද ඔත්තුකරුවන් මඟින් බ්‍රිතාන්‍යයට තොරතුරු දැනගන්නට ලැබී තිබුණි. එහෙත් 1943 වන තෙක් ඒ පිළිබඳව කිසිදු සාක්ෂියක් හඳුනාගැනීමට ඔවුනට හැකිවූයේ නැත. එම වසරේ දී මොරොක්කෝවේ ටැන්ජියර් (Tangier) නගරයේ බ්‍රිතාන්‍යය බැංකුවක් විසින් ප්‍රථම වරට මෙම ව්‍යාජ මුදල් නෝට්ටුවක් පිළිබඳ ව වාර්තා කළේ ය. මෙම ව්‍යාජ මුදල් නෝට්ටුව බ්‍රිතාන්‍යයේ සැබෑ පවුම් නෝට්ටු සමඟ සාකල්‍යයෙන් ම සමාන එකක් විය. ඒ නිසා ම, එය "මෙතෙක් දුටු භයානක ම දෙය" ලෙස බ්‍රිතාන්‍යය සඳහන් කර ඇත.




**වම්පසින් ඇත්තේ සැබෑ බ්‍රිතාන්‍ය මුද්දරයකි. ව්‍යාජ නාසි මුද්දරයක් දකුණුපසින් ඇත. එහි ස්ටාලින්ගේ හිස සහ දාවිත්ගේ තරුව දැකිය හැක. යුදෙව්වන් සහ කොමියුනිස්ට්වාදීන් කෙරෙහි බ්‍රිතාන්‍ය ජාතිකයින් තුල වෛරය ඇති කිරීම මෙම ව්‍යාජ මුද්දරය නිකුත් කිරීමේ අභිප්‍රාය විය.**

බ්‍රිතාන්‍ය පවුම් නෝට්ටු හැරුණු විට මෙම මුද්‍රණාලයෙහි රුසියන් රූබල් නෝට්ටු ද සීමිත ප්‍රමාණයක් මුද්‍රණය කරනු ලැබීය. එ මෙන් ම සෝවියට් හමුදා සහ පොලිස් නිලධාරීන් ගේ හැඳුනුම්පත්, ඇමෙරිකානු, බ්‍රිතාන්‍ය සහ ස්විට්සර්ලන්ත ව්‍යාජ විදේශ ගමන් බලපත්‍ර, ටියුනීසියන් හැඳුනුම්පත්, බ්‍රිතාන්‍ය විවාහ සහතික, ඇමෙරිකානු සොල්දාදුවන් ගේ පෞද්ගලික ගෙවීම් පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් (Paybooks) ව්‍යාජ ලෙස නිපදවූහ. එ මෙන් ම, මෙම ව්‍යාජ නිෂ්පාදන අතර බ්‍රිතාන්‍ය තැපැල් මුද්දර ද විය. මෙය ප්‍රචාරක කටයුතුවල කොටසක් ලෙස කරන ලද අතර එ මඟින් මහජන ප්‍රසාදය දිනා ගැනීමට උත්සාහ කෙරිණි. තැපැල් මුද්දරවල පස්වන ජෝර්ජ් රජුගේ හිස වෙනුවට ස්ටාලින් (Stalin) ගේ හිස ද ඔටුන්නෙහි දිළිසෙන දියමන්තිය වෙනුවට යුදෙව් සංකේතයක් වන දාවිත් ගේ තරුව (Star of David) ද යොදා තිබිණි. මෙම මුද්දර ගුවන් මඟින් බ්‍රිතාන්‍යයට හෙළීම ද එංගලන්තයේ සිටි ජර්මන් නියෝජිතයෝ සැබෑ මුද්දර වෙනුවට මෙම මුද්දර ලිපි කවරවල ඇලවීම ද කළහ. තැපැල් සේවකයෝ ද වැඩි අවධානයකින් තොරව ම මේවා තැපැල් කටයුතු සඳහා යොදාගත්හ. මෙම මුද්දර ඇස ගැටීමෙන් මිනිසුන් කොමියුනිස්ට්වාදීන් හා යුදෙව්වන් කෙරෙහි වෛර බඳිනු ඇතැයි නාසීහු අපේක්ෂා කළහ.

**මුදල් නෝට්ටු සංසරණයට එක්කිරීම**

මුදල් සංසරණය සඳහා නොයෙකුත් ආකාරයේ සැලසුම් සකස් කළ ද අත්හදාබැලීම් කළ ද වඩාත් වාසි දායක වන්නේ ඒවා ගුවනින් බ්‍රිතාන්‍යයට හෙළීමෙන් නොවන බවත් තමනට අවශ්‍ය වටිනා දෑ මිල දී ගැනීම හරහා සංසරණයට එක් කිරීම වඩා වැදගත් බවත් නාසීහු වටහාගෙන සිටියහ. ඒ සඳහා ලොව පුරා බෙදාහැරීමේ ජාලයක් පිහිටුවිය යුතු විය. එ වකට උතුරු ඉතාලියේ දකුණු ටිරෝල් (Tyrol) පළාතේ මෙරානෝ (Merano) දිස්ත්‍රික්කයේ පිහිටි පැරණි හෝටලයක් නාසීහු නොයෙකුත් ජාවාරම් කටයුතු සඳහා යොදා ගෙන සිටියහ. එය තමන් ගේ මුදල් විශුද්ධිකරණ කටයුතු සඳහා යොදා ගැනීමට නාසීහු තීරණය කළහ.

මුදල් සංසරණයෙහි මූලිකත්වය ගැනීමට තෝරාගත්තේ පෝල් ස්වෙන්ද් (Fritz Paul Schwend) නමැත්තෙකි. වංචනික කටයුතු සම්බන්ධයෙන් 1941 දී අත්අඩංගුවට පත් වූ ඔහු 1942 දී එයින් නිදහස් කළ නාසීහු ඔහු ව තම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කොට ගත්හ. එතැන් සිට ඔහුව හඳුන්වන ලද්දේ ස්වෙන්ද් ලෙසින් නොව වෙන්ඩිග් (Dr. Wendig) යනුවෙනි. ඔහු ලොව බොහෝ රටවල් සමඟ සම්බන්ධතා තිබූ අයෙකි. මෙරානෝ අසල ඔහු ගේ ප්‍රධාන කාර්යාලය පිහිටා තිබුණි. එය හඳුන්වන ලද්දේ ලැබර්ස් මැදුර (Castel Labers) යනුවෙනි. ඇත්තෙන් ම, නිල වශයෙන් එම ස්ථානය හඳුන්වන ලද්දේ "Special Task General Commando III. Germanic Panzer Corps" යනුවෙනි.

විකිණීම සඳහා සකස් කළ ව්‍යාජ නෝට්ටු ස්වෙන්ද් හට ලැබුණේ එ තැනට ය. ඔහුට ප්‍රධාන වශයෙන් ලැබුණේ තුන්වන පංතිය යටතේ වර්ග කෙරුණු නෝට්ටු ය. ඔහු ඉතා කඩිනමින් ව්‍යාජ මුදල් බෙදා හැරීමේ ජාලයක් සැකසුවේ ය. ව්‍යාජ මුදල් මඟින් මුදල්, රන්, රිදී සහ මැණික් මිල දී ගත හැකි නියෝජිතයෝ ඔවුන් අතර සිටියහ. ඔහු ගේ මුල් නියෝජිතයන් වූයේ ඉතාලියේ හා ස්විට්සර්ලන්තයේ බැංකු ලිපිකරුවන්, ස්වීඩනයේ, පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ හෝටල් කළමනාකරුවන් හා හෝටල් හිමිකරුවන් ය. පසු ව මෙම නියෝජිත ජාලය අප්‍රිකාව, එක්සත් ජනපදය, ආර්ජන්ටිනාව, බ්‍රසීලය, චිලී, හොන්ඩියුරාස්, උරුගුවේ, ඉන්දියාව, චීනය දක්වා ද පුළුල් කළේ ය. එ මෙන් ම සෑම යුරෝපීය රටක ම පාහේ වෙසෙන ඉහළ මට්ටමේ ව්‍යාපාරික ප්‍රජාව ද ආරක්ෂක අංශයේ නිලධාරීන්, වෙනත් රාජ්‍ය නිලධාරීන්, කාර්මිකයන්, තානාපති නිලධාරීන් ඇතුළත් වන සේ එම ජාලය තවදුරටත් තර කළේ ය. මෙම නියෝජිත ජාලය හරහා අමුද්‍රව්‍ය හා අවි ආයුධ මිල දී ගැනීමට ව්‍යාජ මුදල් යොදවනු ලැබීය. ඒවා අව්‍යාජ මුදල්වලට මාරු කරවීම ද සිදු කෙරිණි. බ්‍රිතාන්‍යයේ, එක්සත් ජනපදයේ හා තුර්කියේ සිටි නියෝජිතයන්ට ගෙවීමට යොදවන ලද්දේ එ ලෙස හුවමාරු කරගත් අව්‍යාජ මුදල් ය. නාසීහු එම මුදල්වල වටිනාකමින් සියයට 33ක වටිනාකමක් ස්වෙන්ද් හට ගෙවන ලද අතර ඔහු සිය නියෝජිතයන්ට එයින් සියයට 26ක් ලබා දුන්නේ ය.

එ වකට තුර්කියෙහි සිටි බ්‍රිතාන්‍ය තානාපතිවරයා ගේ පෞද්ගලික උපස්ථායක ලෙසින් ක්‍රියා කර ඇත්තේ ද ජර්මන් ඔත්තුකරුවෙකි. සිසෙරෝ (Cicero) ලෙස හැඳින්වුව ද ඔහු ගේ සැබෑ නම වූයේ එලීසා බස්නා (Elyesa Bazna) යන්න ය. තෙහෙරාන් සමුළුවෙන් (Teheran Conference) පසු මිත්‍ර පාර්ශ්වයේ එක්වීම හා එය වර්ධනය වීම සම්බන්ධ තොරතුරු සොයා බලා වාර්තා කිරීම ඔහු ගේ වගකීම විය. මේ සේවය වෙනුවෙන් ඔහුට දෙවන වර්ගයට අයත් ව්‍යාජ නෝට්ටුවලින් පවුම් 300,000 ක් ගෙවනු ලැබීය. මෙය එ කල පැවැති ජර්මන් මාර්ක් (Reichmark) මිලියන හයකට සමාන මුදල් ප්‍රමාණයක් විය. මොහු දකුණු අප්‍රිකාවට පැන යන තුරු ම ඔහු ගේ ඔත්තු සේවා පිළිබඳ තොරතුරු හෙළි නො වී ය.

ඉතාලියේ ගනුදෙනු කිරීමේ දී ව්‍යාජ පවුම් නෝට්ටු පළමු ව බඩොග්ලියෝ (Badoglio) ගේ ලීරාවලට හෝ මුසෝලිනී ගේ RSI (The Repubblica Sociale Italiana) ලීරාවලට හෝ මාරු කෙරිණි. එයින් පසු ඒවා දකුණු ප්‍රදේශයෙහි ලීරාවලට ද රන් හා මැණික්වලට ද හුවමාරු කළහ. මෙම මැණික් ස්විට්සර්ලන්තයට යවන ලද අතර ඒවා යොදවා ස්විස් ෆ්‍රෑන්ක්, එක්සත් ජනපද ඩොලර් හෝ ස්වීඩිස් ක්‍රෝන් මිල දී ගත්හ. කෙ සේ වෙතත් මැණික් වෙනුවෙන් ව්‍යාජ මුදල් ලැබීමේ ඉඩක් වූ හෙයින් පවුම් මිල දී ගැනීම තහනම් කොට තිබිණි.

කටයුතු මෙ සේ සිදු වුව ද මේ වන විට ස්වෙන්ද් ගේ තත්ත්වය අනතුරුදායක විය. මිත්‍ර පාක්ෂික නියෝජිතයන්ට ඔහු පිළිබඳවත් ඔහු ගේ ජාවාරම් පිළිබඳවත් ඒ වන විට ඉව වැටී තිබුණෙන් ඔවුහු ඔහු අල්වා ගැනීමේ අභිලාසයෙන් පසුවූහ. අනෙක් අතට ඔහු ගේ කටයුතුවල ප්‍රගතිය, දියුණුව පිළිබඳව මෙන් ම නාසි සංවිධානයේ ඉහළ පෙළේ අය හා තිබුණු සම්බන්ධතා පිළිබඳවත් නාසීන් ඇතැමකු අතර ද ඊර්ෂ්‍යා සහගත ආකල්පයක් උද්ගත ව තිබිණි. විශේෂයෙන් ම නාසි රහස් පොලීසිය වූ ගෙස්ටාපෝවෙහි (Gestapo) ප්‍රධානියාව සිටි හෙන්රිච් මුලර් (Heinrich Mueller) ස්වෙන්ද් පිළිබඳව බොහෝ තොරතුරු සෙව්වේ ය. එ සේ සොයාගත් තොරතුරුවලට අනුව ඔහු උපතින් යුදෙව්වෙක් වූයේ ය. එ මතු නොව ඔහු විවාහ වී සිටියේ ද යුදෙව් කාන්තාවක් සමඟ ය. එහෙත් ස්වෙන්ද් එම චෝදනා එක හෙලා ම ප්‍රතික්ෂේප කළේ ය. තමා පිරිසිදු ඒරියන්වාදියකු (Arian) බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළේ ය. කෙ සේ වෙතත්, ඒ වන විට යුද්ධය හැරී තිබුණේ ජර්මන් නාසි පක්ෂයට හිතකර ලෙස නොවන වග ඔහු වටහා ගෙන සිටියේ ය.

මේ අතර 1944 අගෝස්තු මස තුර්කි රජය වෙනස්වීමත් සමඟ ම ජර්මනියට තුර්කියේ මැදහත්භාවය ද අහිමි විය. තුර්කියෙන් හණ රෙදි ගෙන ඒමේ ඉඩකඩ ද ඇහිරිණි. මේ නිසා කඩදාසි කම්හල්වලට බර්න්හාඩ් කෘගර්ට අවශ්‍ය ආකාරයේ ප්‍රමිතියෙන් යුත් කඩදාසි සැපයිය හැකි නො වී ය. සැපයූ කඩදාසි බාල තත්ත්වයේ විය. ඒවායින් නිපදවන ලද මුදල් නෝට්ටු පාරජම්බුල කිරණ පරීක්ෂාවෙන් නුසුදුසු ඒවා ලෙස ප්‍රතික්ෂේප විය. එ බැවින්, නාසීහු පවුම් නෝට්ටු මුද්‍රණ ව්‍යාපෘතිය නවතා ඇමෙරිකන් ඩොලර් නිෂ්පාදනය දෙසට අවධානය යොමු කළහ.

### ව්‍යාජ ඩොලර් මුද්‍රණය දෙසට හැරීම

1944 සැප්තැම්බර් මාසයේ දී නාසීහු ඇමෙරිකන් ඩොලර් මුද්‍රණය කිරීමේ කටයුත්ත ඇරඹූහ. මෙම කාර්යය සැලසුම් කිරීම තෝරාගත් සිරකරුවන් 8 දෙනකුට පැවරිණි. ඔවුන් අතරින් සැලොමොන් ස්මොලිනොෆ් (Salomon Smolinoff) ගේ කාර්යභාරය සුවිසල් විය. ඔහු නාසීන් ගේ අත්අඩංගුවට පත්වීමටත් ප්‍රථම ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදුණු අයෙකි. තමන්ට පැවරුනු කටයුත්ත පෙලදර්ශ (Collotype) ලුහු තාක්ෂණික ක්‍රමය මඟින් කිරීමට ඒ සඳහා අනුයුක්ත කළෝ සැලසුම් කළහ. ජෙලි වැනි ලාටු සහිත මිශ්‍රණයක් තැවරූ වීදුරු තහඩු මත ප්‍රතිඡායා (Negatives) එලක තබා මුද්‍රණය කිරීම මෙම ක්‍රමයේ දී සිදුවිය. ඔවුහු දීර්ඝ කාලයක් තිස්සේ මෙම ක්‍රමය යොදාගනිමින් ව්‍යාජ ඇමෙරිකන් ඩොලර් නෝට්ටු නිෂ්පාදනයට උත්සාහ කළහ. ස්මොලිනෝෆ් මාස හතරක් තිස්සේ අත්හදාබැලීම් රැසක් කළ ද ඒ සියල්ල ම අසාර්ථක විය. 1945 ජනවාරි වන විට ඔහු සිය 200 වැනි අසාර්ථක උත්සාහය ද දරා තිබුණේ ය.

මෙම කටයුත්ත සඳහා යොදා ගැනීමට නියමිත වූ ජෙලටීන් මිශ්‍ර (Gelatinous Emulsion) තැවරුම සැකසීමේ වගකීම භාර දී තිබුණේ ඕලන්ද ජාතික යුදෙව්වකු වූ රසායනඥ ඒබ්‍රහම් ජාකොබ්සන් (Abraham Jacobson) හට ය. ඔහු උපායශීලී ව ඩොලර් මුද්‍රණය පමාකිරීමේ උත්සාහයක නිරතවූයේ ය. ඒ, මුද්‍රණ කටයුත්තේ නිමාව තම ජීවිතවල ද නිමාව වන බව ඔහු දැන සිටි හෙයිනි. එම ක්‍රියාවලිය කඩාකප්පල් කිරීමේ අදහසින් ඔහු මිශ්‍රණ සංයුතිය මනා ලෙස පිළියෙල නො කළේ ය. මුද්‍රණ ප්‍රතිඵලය අසාර්ථක වූයේ ඒ හේතුවෙනි. නෝට්ටු මුද්‍රණ සැලසුම දියත් කොට සිව් මසක් ගතවෙන තෙක් ද ඉහළ නිමාවකින් යුත් ඩොලර් මුද්‍රණය කළ නො හැකි විය. එය නාසීන් ගේ සැකයට හේතු විය. එයින් ඉදිරියට වූ සති තුන ඇතුළත ඩොලර් මුද්‍රණය නො කළ හොත් සිරකරුවන් හතර දෙනකු වෙඩි තබා මරා දමන බවට කණ්ඩායම භාර කෘගර් තර්ජනය කළේය. එම කාලය ද ක්‍රම ක්‍රමයෙන් ගෙවී යන්නට විය. ඩොලර් මුද්‍රණ කාර්යය තවදුරටත් පමා කිරීමට ඉඩක් නො වී ය. ඩොලර් නෝට්ටු නිර්මාණ සැලැස්මේ සාර්ථකත්වය මත ඔවුන්ගේත් මුද්‍රණ කටයුත්තට සම්බන්ධ වූ අනෙකුත් සිරකරුවන්ගේත් ජීවිත රැඳී තිබිණි. අවසන මුද්‍රණ සිරකරුවන්ට තවත් කෙටි කාලයකට හෝ ජීවත් වීමේ වාසනාව හිමිකර දෙමින් තමන්ට පැවරූ මුද්‍රණ කටයුත්ත නිසි පරිදි කළ හැකි බව නාසීන් හට ඔප්පු කර පෙන්වීමට ස්මොලිනෝෆ් සමත් වූයේ ය. ඔහු දැරූ 250 වැනි උත්සාහය සාර්ථක විය.

1945 පෙබරවාරි මස 22 වන දින වන විට මුද්‍රණය කළ හැකි වූයේ ඩොලර් 20,000ක් (එ නම්, ඩොලර් 100 නෝට්ටු 200ක්) පමණි. ඇමෙරිකන් ඩොලර් නෝට්ටු මිලියනයක් මුද්‍රණය කිරීමේ ඇරඹුම පසු දිනට යොදාගෙන තිබිණි. එහෙත් සෝවියට් හමුදාව මේ වන විට බර්ලිනයට සැතපුම් සිය ගණනක් ආසන්න වී සිටියහ. සෑම අතින් ම දක්නට ලැබුණේ නාසි බලය බිඳ වැටීමේ ලකුණු ය. මේ නිසා ඩොලර් මුද්‍රණ කටයුත්ත වහා නතර කරන ලෙසත් මුද්‍රණාලය හා එහි උපකරණ ඉවත්කරන ලෙසත් කඳවුරේ වූ වටිනා සියලු දෑ සුරක්ෂිත ලෙස ලී පෙට්ටිවල අසුරන ලෙසත් අනෙකුත් සියලු දෑ විනාශ කර දමන ලෙසත් රයිච් ප්‍රධාන කාර්යාලයෙන් (Reich Security Head Office - RSH) අණ ලැබුණි. ඒ අනුව මුද්‍රණාලය ගලවා එහි සියලු ම උපකරණ, යන්ත්‍රසූත්‍ර, මුද්‍රණ තහඩු, වෙනත් උපකරණ ආදිය දුම්රියට පැටවීමට සිරකරුවන්ට සිදුවිය. එ මෙන් ම මුදල් නෝට්ටු, වෙනත් වටිනා දෑ හා රහසිගත ලේඛන ආදිය ජලය කාන්දු නොවන පෙට්ටිවල බහා රැකවලුන් ද සහිත ව ජර්මනියෙන් සැතපුම් 500ක් පමණ දුරින් වූ ඔස්ට්‍රියාවේ මෝතෝසන් (Mauthausen) කඳවුර බලා පිටත්කර යැවිණි.



**1945 වසරේ දී සච්සෙන්හවුසෙන් කඳවුරේ සිටි ව්‍යාජ මුදල් නිෂ්පාදනය සඳහා දායක වූ සිරකරුවන් පිරිසක්. මෙහි දෙ වන පේළියේ දකුණු කෙළවරේ මිතුරකුගේ උරහිසට ඉහළින් ඉදිරියට නැමී සිටින්නේ ඇඩොල්ෆ් බර්ගර් ය.**

සච්සෙන්හවුසෙන් කඳවුර හිස් කිරීමේ දී ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට යොදාගත් සිරකරුවන් කණ්ඩායම ඔස්ට්‍රියානු මෝතෝසන් කඳවුරට ද අනතුරුව ඇල්ප්ස් ආසන්නයේ රෙඩ්ල්සිෆ් (Redl-Zipf) කඳවුරට ද මාරුකර ඇත. මැයි මස මුල මොවුන් එබන්සී (Ebensee) කඳවුරට මාරුකොට යවා එ තැන දී ඝාතනය කිරීමට සැලසුම් කොට තිබිණි. එහෙත් සිරකරුවන් එබන්සී කඳවුර කරා ගෙන යෑමට කඳවුර සතුව තිබුණේ එක් ලොරියක් පමණි. මේ නිසා සිරකරුවන් තෙවරක දී එබන්සී කඳවුර කරා ගෙන යෑමට මොවුනට සිදුවිය. කණ්ඩායම් දෙකක් කඳවුර වෙත ගෙන ගොස් රැකවල් තබා තෙවන සිරකරුවන් පිරිස රැගෙන යන අතර ලොරිය අතර මඟ දී ක්‍රියා විරහිත විය. මේ නිසා තෙවන සිරකරුවන් කණ්ඩායමට සිදු වූයේ එබන්සී දක්වා පයින් ගමන් කිරීමට ය. ඔවුහු මැයි මස 04 වන දින එබන්සී කඳවුර වෙත ළඟා වූහ. පෙර පැමිණි ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණ සඳහා යොදාගත් සිරකරුවෝ ඒ වන විට කඳවුරෙහි සිටි අනෙකුත් සිරකරුවන් සමඟ මුසු ව සිටියහ. නියෝග දී තිබුණේ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණ කටයුතුවලට සම්බන්ධවූ සියලු ම සිරකරුවන් එකවර

මරා දැමීමට ය. එහෙත් තෙවන කණ්ඩායම පැමිණීමේ ප්‍රමාදය හේතුවෙන් ඔවුන් සියලු දෙනා ගේ ම දිවිරැකගැනීමට අවස්ථාව සැලසිනි.

1945 මැයි මස 06 වන දින එබන්සී සිරකඳවුර ඇමෙරිකන් හමුදාව විසින් නිදහස් කරගන්නා ලදී. යුදෙව් ජාතික මුද්‍රණකරුවකු ව සිට පසු ව නාසීන් ගේ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණකරුවකු බවට පත් වූ ඇඩොල්ෆ් බර්ගර් නාසි ග්‍රහණයෙන් මිදුනු වහා ම සිය ගම රට බලා ගිය ද නාසීහු ඒ වන විටත් ඔහු ගේ නිවැසි සාමාජිකයෝ නාසි කඳවුරු කරා ගෙන ගොස් ඝාතනය කොට තිබිණි. මේ නිසා ඔහු චෙක් රාජ්‍යයෙහි ප්‍රාග් (Prague) නුවර බලා ගොස් එහි පොලීසියට ත්‍රාසජනකවූත් ඉතාමත් ම ඛේදජනකවූත් බර්න්හාඩ් මෙහෙයුම පිළිබඳව දැනුම් දුන්නේ ය. එයින් නො නැවතී ඒ වන විටත් බැංකුවල තැන්පත් කර තිබූ මුදල් පරීක්ෂා කොට ව්‍යාජ පවුම්වලින් 1/3 ක් හඳුනා ගැනීමට ද ඔහු උදව් කළේ ය. 1945 අගෝස්තු මාසයේ දී බර්න්හාඩ් මෙහෙයුම පිළිබඳව සිය මතකයන් අලලා "අංක 64401 කතා කරයි" ("Cislo 64401 mluvi"- "Number 64401 Speaks") යනුවෙන් කෘතියක් ඔහු විසින් ලියා පළ කළේ ය. චෙක් භාෂාවෙන් පිටු 86 ක් පුරා ලියැවුනු එහි ඡායාරූප 6 ක් ද ඇතුළත් විය. පසුව ඔහු පුවත්පත් කලාවේදියකු වශයෙන් කටයුතු කරමින් යුරෝපය මුලුල්ලේ ඇවිද සොයාගත් 200කට අධික ලිපිලේඛන හා ඡායාරූප ඇතුළත් කොට Des Teufels Werkstatt කෘතිය කොමියුනිස්ට්වාදී නැගෙනහිර ජර්මනියේ දී ප්‍රකාශයට පත් කළේ ය. එය මධ්‍යම යුරෝපීය භාෂා කිහිපයකින් පළ කරන ලද අතර 2009 දී The Devil's Workshop යනුවෙන් ඉංග්‍රීසි බසින් ද පළ කෙරිණි. 91 වැනි වියේ දී, එ නම් 2009 වසරේ දී ඇඩොල්ෆ් බර්ගර් මෙම ඉංග්‍රීසි පරිවර්තනය එළි දැක්වීමේ උළෙලට සහභාගිවීමට ලන්ඩන් බලා ගියේ ය. 2009 පෙබරවාරි මස එංගලන්ත මහ බැංකුව සිය ආයතනයට පැමිණෙන ලෙස බර්ගර්ට ආරාධනා කළේ ය. මෙම ආරාධනය පිළිගත් බර්ගර් එහි ගොස් තමන් විසින් ම මුද්‍රණය කරන ලද ව්‍යාජ මුදල් හඳුනා ගත්තේ ය. ඔහු විසින් ඒවා තමන් මුද්‍රණය කළ ඒවා බවට හඳුනාගනු ලැබුවේ ආලෝකයට අල්ලා බලා යම් සියුම් සලකුණක් හඳුනාගැනීමෙනි. ටයිම් (The Time) සඟරාව සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක දී ඔහු ඒ පිළිබඳ ව ද සඳහන් කළේ ය.

**ටොප්ලිට්ස් විල**

ඔස්ට්‍රියාවේ ඇල්ප්ස් කඳුකරයේ ඝණ වනාන්තරයක පිහිටි ටොප්ලිට්ස් (Toplitz) විලෙහි දිග කිලෝ මීටර් 1 .6 කි. ගැඹුර මීටර් 100ට වඩා වැඩිය. මෙම විලෙහි මීටර් 20ක් පමණ ඉක්මවා ගැඹුරට ගිය තැන ඔක්සිජන් නොමැත. මාළු ජීවත්වන්නේ මීටර් 18 ට ඉහළින් වූ ජල මට්ටමෙහි පමණකි. වසරෙහි අඩක් පමණ කාලයක් මෙම විල අයිස්වලින් වැසී යයි. ගැඹුරු දියෙහි ඔක්සිජන් රහිත තත්ත්වය නිසා මෙහි ගිල්වන ලද යමක් ඉතා දීර්ඝ කාලයක් වැඩි වෙනසකට බඳුන් නොවී කල් පවතී. 1943 නාසීහු මේ අසල ඔවුන් ගේ නාවුක හමුදා පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටවූහ. රහසිගත ආයුධ වැඩි දියුණු කිරීම්, තුවක්කු සඳහා විශේෂ පුපුරන ද්‍රව්‍ය, ස්වයංක්‍රීය ව මඟ පෙන්වන ටෝපිඩෝ, කුඩා සබ්මැරීන් ආදිය මෙහි දී නිපදවා ඇත. පරාජයත් සමඟ ආයුධ, පුපුරන ද්‍රව්‍ය, අත්හදා බැලීම් පිළිබඳ ලිපිලේඛන වාර්තා, මුද්‍රණය කරන ලද මුදල් නෝට්ටුවලින් විශාල ප්‍රමාණයක් බහාලන ලද පෙට්ටි, සේප්පු සහ ඒවායේ තොරතුරු ද සමඟින් මුද්‍රණ යන්ත්‍ර ද එබන්සී අසල ටොප්ලිට්ස් විලෙහි ගිල්වන ලදැයි විශ්වාස කෙරේ.



**ටොප්ලිට්ස් විලෙන් ගොඩ ගන්නා ලද ව්‍යාජ මුදල්**

මෙම විශ්වාසය පසුපස හඹාගියෝ රැසකි. පරාජයට පත් නාසීන් විසින් එතෙක් කල් එක් රැස්කරන ලද රත්තරන්, මැණික් ආදී ධන සම්භාරය මෙහි සඟවන්නට ඇතැයි සැකකරමින් ඒවා සොයා ගොස් මෙම විලෙහි ගවේශනවල යෙදී විපතට පත්වූවෝ ද රැසකි. එ මෙන් ම ගවේශන තුළින් සාර්ථක ප්‍රතිඵල නෙලාගත්තෝ ද කිහිප දෙනෙකි. 1959 වසරෙහි ගවේශනයේ යෙදුනු කණ්ඩායමක් පෙට්ටිවල බහා විලෙහි ගිල්වා තිබූ ව්‍යාජ පවුම් නෝට්ටු මිලියන 72ක් සොයාගැනීමට සමත්වූහ. ධන සම්පත් සොයා මෙම විලෙහි කෙරෙන ගවේශන කටයුතු ඔස්ට්‍රියානු රජය විසින් තහනම් කරන ලද අතර ඔස්ට්‍රියානු රජය විසින් ද නිල ගවේශන පමණක් සිදුකරනු ලැබේ. වරෙක කළ ගවේශනයක දී, ව්‍යාජ මුදල් නෝට්ටු ඇසිරූ පෙට්ටි 18ක් සහ ඒවා මුද්‍රණය කිරීමට යොදා ගත් මුද්‍රණ තහඩු සොයාගැනීමට ඔස්ට්‍රියානු රජය සමත් විය. 1983 වසරෙහි ජෛව විශේෂඥයකු වූ මහාචාර්ය හෑන්ස් ෆ්‍රික් ඔස්ට්‍රියානු රජයෙන් ලබාගත් අවසරය ද ඇතිව ඔක්සිජන් රහිත මෙම විල පතුලෙහි පැවතිය හැකි ජීවය පිළිබඳ පර්යේෂණ පැවැත්වීය. එහි දී ඔහු නොයෙකුත් බැක්ටීරියා වර්ග හා පනු විශේෂයක් පිළිබඳ තොරතුරු හෙළිදරව්කර ගත්තේ ය. එ පමණක් නොව බ්‍රිතාන්‍ය ව්‍යාජ පවුම් නෝට්ටු ද විලට කඩා වැටී තිබුණු රොකට් සහ මිසයිල කැබලි තොගයක් ද ඔහු දැක ඇත.

23 වන පිටුවට...

# ලෝක මූල්‍ය සහ ආර්ථික අර්බුදය 2007 - 2011

**පී. සමරසිරි**

සහකාර අධිපති

## 1. හැඳින්වීම

2007 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ලෝකය පුරා මූල්‍ය සහ ආර්ථික අර්බුදයක් ව්‍යාප්ත වූ අතර එය ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ප්‍රමුඛ නොවන උකස් ණය (Sub Prime Mortgage) වෙළෙඳපොළින් ඇති වූ බවට පොදුවේ අදහස් කෙරේ. ප්‍රමුඛ නොවන උකස් ණය සම්බන්ධ සුරැකුම්කරණ වෙළෙඳපොළ පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය බිඳී යාමෙන් එම වෙළෙඳපොළේ ගනුදෙනු වූ විවිධ සුරැකුම්ගත බැඳුම්කර සහ සුරැකුම් කෙටිකාලයක් තුළ අලෙවි කිරීමත් ඒවායේ ඉල්ලුම කඩාවැටීමත් හේතු කොට මෙම අර්බුදය ආරම්භ වූ අතර පසුව ලෝකය පුරා බැංකු සහ මූල්‍ය වෙළෙඳපොළවල් පිළිබඳව ද විශ්වාසය ක්‍රමයෙන් බිඳ වැටෙමින් ලෝක මූල්‍ය අර්බුදයක් වශයෙන් ව්‍යාප්ත විය. මූල්‍ය අංශය සහ මූර්ත ආර්ථික අංශය (නිෂ්පාදන, ආයෝජන හා පරිභෝජන කටයුතු) බැඳී පවතින බැවින් මූල්‍ය සහ බැංකු වෙළෙඳපොළවල් කඩාවැටීම හෝ පහළයාම තුළින් ආර්ථික කටයුතුවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් ප්‍රමාණවත්ව නොලැබීමෙන් නිෂ්පාදන, ආයෝජන, පරිභෝජන, ආනයන සහ අපනයන කටයුතු පහළ යාමෙන් ලෝක ආර්ථික අර්බුදයක් ද පසු කාලයේ පැතිර යන ලදී. මෙම මූල්‍ය සහ ආර්ථික අර්බුදය ලෝකයේ තවමත් පවතී. ලෝකයේ බැංකු, මූල්‍ය සහ භාණ්ඩ සහ සේවා වෙළෙඳපොළවල ඇති අන්තර් සබඳතාවය මැනවින් පෙන්වන උදාහරණය මෙම ලෝක ආර්ථික හා මූල්‍ය අර්බුදයයි.

## 2. අර්බුදය පැතිර යාම සහ හේතු

මෙම අර්බුදය පැතිරීම පිළිබඳ හේතු සහ සිද්ධි දීර්ඝ වශයෙන් සාකච්ඡා වන අතර එහි සාරාංශයක් පහත ලෙස දැක්විය හැකිය.

**(අ) ඇමෙරිකාවේ ප්‍රමුඛ නොවන උකස් ණය වෙළෙඳපොළ දියුණුවීම සහ කඩාවැටීම** - ඇමෙරිකන් රජයේ ප්‍රතිපත්තිය අනුව සෑම පවුලකට ම නිවසක් ලබාදීමේ අරමුණ යටතේ නිවාස උකස් ණය ප්‍රවර්ධනය කිරීමේ හේතුවෙන් උකස් ණය ආශ්‍රිත ණය සහ මූල්‍ය වෙළෙඳපොලවල් දියුණු විය. මෙහි දී පුද්ගලයකුගේ හෝ පවුලේ ණය ඉතිහාසය (Credit History) එතරම් නොබලා ණය ගෙවීමේ හැකියාව පිළිබඳ ලිහිල් ඇගයීම මත බැංකු වලින් ණය ලබාදීම නිසා විශාල උකස් ණය වෙළෙඳපොළක් බිහි විය. බැංකු ප්‍රමුඛ නොවන උකස් ණය ඒකක පිහිටුවා විශාල වශයෙන් මෙම ප්‍රමුඛ නොවන ගනුදෙනුකරුවන්ට (Sub Prime Customers) ණය ලබාදුනි. මොවුන් ප්‍රමුඛ නොවන ගනුදෙනුකරුවන් ලෙස හඳුන්වන්නේ හොඳ ගනුදෙනුකරුවන් (Prime Customers) මෙන් ණය ඉතිහාසයක් නොමැතිවීමෙන් ණය නිසි පරිදි ගෙවීම කරයි ද යන්න හොඳ තක්සේරුවක් නොමැති බැවිනි. මූල්‍ය අර්බුදයේ දී මෙම ණය වෙළෙඳපොළ මුලින් ම කඩා වැටුනි.

**(ආ) සුරැකුම්කරණ මූල්‍ය** (Structured Finance) **වෙළෙඳපොළ දියුණු වී කඩා වැටීම** - නිවාස උකස් ණය දිගුකාලීන ණය බැවින් කෙටිකාලීන තැන්පතු මුදල් යොදාගෙන විශාල වශයෙන් දිගුකාලීන ණය ලබාදීම තුළින් බැංකුවලට ද්‍රවශීලතා ප්‍රශ්න ඇතිවන බැවින් එයට විසඳුමක් ලෙස බැංකු විසින් විශාල වශයෙන් මෙම උකස් ණය සුරැකුම්කරණ වෙළෙඳපොළ තුළින් විකිණීම කරන ලදී. මේ හේතු කොට ගෙන සුරැකුම්ගත බැඳුම්කර වෙළෙඳපොළ දියුණු වූ අතර බැංකු විසින් බොහෝ ණය සුරැකුම්කරණය තුළින් අලෙවි කරන ලදී. මෙම සුරැකුම්ගත බැඳුම්කරවල ප්‍රමුඛ නොවන උකස් ණය සහ වෙනත් ණය වර්ග රාශියක් අන්තර්ගත විය. සුරැකුම්ගත බැඳුම්කර වෙළෙඳපොළේ බැංකු, අරමුදල් සමාගම්, ආයෝජන බැංකු සහ පුද්ගලයන් විශාල වශයෙන් මුදල් ආයෝජනය කරන ලදී. මූල්‍ය අර්බුදය ආරම්භ වූයේ මෙම සුරැකුම්ගත බැඳුම්කර වෙළෙඳපොළ පිළිබඳ ආයෝජක විශ්වාසය බිඳී යාමෙනි.

**(ඇ) ප්‍රමුඛ නොවන උකස් ණය පැහැර හැරීම ඉහළ යාම නිසා සුරැකුම්ගත බැඳුම්කර පිළිබඳ විශ්වාසය බිඳීයාම** - බැංකුවලින් ලබා දී තිබූ උකස් ණය 2005 සිට ගෙවීම පැහැර හැරීම වැඩි වී 2007 වන විට පැහැර හැරීමේ අනුපාතය 12% පමණ දක්වා ඉහළ යන ලදී. දියුණු රටවල බැංකු ණය පැහැර හැරීමේ අනුපාතය සාමාන්‍යයෙන් 1% ට වඩා අඩු නිසා ප්‍රමුඛ නොවන

උකස් ණය පැහැර හැරීමේ අනුපාතය ඉතා අධික එකක් විය. මේ නිසා සුරැකුම්ගත බැඳුම්කරවල මුදල් ආයෝජනය කර ඇති ආයෝජකයන් තමන් සතු බැඳුම්කරවල ප්‍රමුඛ නොවන උකස් ණය අන්තර්ගත වී ඇති බවට සැක කොට 2007 අගෝස්තු මාසයේ මැද සිට විශාල වශයෙන් එම බැඳුම්කර විකිණීමත් පරිණත දිනයේ දී මුදල් ලබාගැනීමත් සිදුකරන ලදී. මෙම බැඳුම්කර සඳහා ඉල්ලුමක් නොමැතිවීමෙන් සුරැකුම්ගත බැඳුම්කර වෙළෙඳපොළ කඩා වැටුන අතර ආයෝජකයන්ගේ මුදල් අහිමි විය. ප්‍රමුඛ නොවන උකස් වෙළෙඳපොළ අර්බුදය යනු මෙයයි.

**(ඈ) බැංකු ද්‍රවශීල අර්බුදය සහ අන්තර් බැංකු ණය වෙළෙඳපොළ කඩා වැටීම** - බැංකු එදිනෙදා ව්‍යාපාර කටයුතු සඳහා අරමුදල් සපයා ගැනීමට තැන්පතු රැස් කිරීමට වඩා සුරැකුම්කරණ වෙළෙඳපොළෙහි ණය විකිණීම කෙරෙහි රැඳී පැවතින. මෙම වෙළෙඳපොළ කඩා වැටීම නිසා බැංකුවලට එදිනෙදා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට නොහැකි විය. තවද, කල්පිරෙන සුරැකුම්ගත බැඳුම්කර සඳහා ආයෝජකයන්ට මුදල් ගෙවීමට මෙම බැඳුම්කර නිකුත් කොට ඇති ආයෝජන බැංකු වලට සිදු වූ බැවින් එම ආයෝජන බැංකු තමන්ට බැංකු විසින් ලබා දී තිබූ "තොග ණය ඉම්" (Warehouse Credit Lines) භාවිතා කිරීමට පටන්ගත් බැවින් ඒවා වෙනුවෙන් මුදල් ලබාදීමට බැංකු වලට විශාල වශයෙන් අරමුදල් අවශ්‍ය විය. සමහර ආයෝජන බැංකු, බැංකුවලට ම අයත් ආයතන විය. බොහෝ බැංකුවල තත්ත්වය අරමුදල් හිඟය වූ බැවින් අන්තර් බැංකු ණය වෙළෙඳපොළේ අරමුදල් සැපයීම සිදු නොවීය. යම් අරමුදල් අතිරික්තයක් තිබූ බැංකු ද අරමුදල් හිඟ පිළිබඳ බියෙන් ණයදීම සඳහා ඉදිරිපත් නොවීය. එබැවින්, අන්තර් බැංකු ණය වෙළෙඳපොළ වැසී ගොස් බැංකු දැඩි ද්‍රවශීල ප්‍රශ්නයන්ට මුහුණ දුනි. මෙම අවස්ථාව ප්‍රමුඛ නොවන උකස් ණය අර්බුදය බැංකු ක්‍රමය වෙත පැතිරී යාමයි.

**(ඉ) බැංකුවල ද්‍රවශීලතා ප්‍රශ්න ඇති බවට රාවය පැතිරීම නිසා තැන්පතු හිමියන් තැන්පතු ආපසු ගැනීමට පෙළඹීම තුළින් බැංකු අර්බුදයක් ඇතිවීම** - එංගලන්තයේ නොදර්න් රොක් (Northern Rock) බැංකුවත් ඇමෙරිකාවේ කන්ට්‍රිවයිඩ් ෆිනෑන්ෂියල් බැංකුවත් (Country-wide Financial) 2007 අගෝස්තු මාසයේ තුන්වන සතියේ තැන්පතු අර්බුදය පටන්ගත් බැංකු දෙකයි. බැංකු වෙබ් අඩවි හරහා මුලින් ම මුදල් ආපසු ගැනීමට උත්සාහ කළ තැන්පතු හිමියන් එය අසාර්ථකවීමෙන් පසුව බැංකු ඉදිරිපිටට රැස්වී දිගු පෝලිම් දක්නට ලැබිය. මේ අනුව තැන්පතු ආපසු ගැනීම පිළිබඳ විද්‍යුත් බැංකු වකිත (Electronic Runs on Banks) සහ සාමාන්‍ය බැංකු වකිත (Depositor Runs on Banks) දක්නට ලැබිය. මේ දක්වා ලෝකයේ බොහෝ රටවල බැංකු කඩාවැටී ඇති අතර ඇමෙරිකාවේ පමණක් 2011 මැයි මස අවසාන වන විට බැංකු 370 ක් වැසී ගොස් තිබිණි.

**(ඊ) බැංකු ණය, වාණිජ පත්‍ර සහ කොටස් වෙළෙඳපොළවල අර්බුදය** - වාණිජ බැංකුවල ද්‍රවශීල ප්‍රශ්න හේතු කොට සමාගම්, ව්‍යාපාරික සහ පරිභෝජන වැනි සියලු ණය දීම බැංකු විසින් අඩු කිරීමෙන් ණය පරිමාව පහළ යන ලදී. තවද, සුරැකුම්කරණ වෙළෙඳපොළේ ආයෝජකයන්ගේ මුදල් අලාභ නිසා ඔවුන් අනෙක් වෙළෙඳපොළවල තිබූ තම ආයෝජන විකිණීමට පෙළඹෙන ලදී. එබැවින්, වාණිජ පත්‍ර සහ කොටස් වෙළෙඳපොළවල ආයෝජන පහළ යාමෙන් එම වෙළෙඳපොළවල් ද අර්බුදයට ලක්විය. 2009 ඔක්තෝබර් මාසයේ දී මුළු ලෝකයේ ම කොටස් වෙළෙඳපොළවල දැඩි අර්බුදයක් සහ කඩාවැටීමක් සිදු විය. උදාහරණ වශයෙන් 2009.10.10 දිනට අවසන් සතිය තුළ ලෝකයේ කොටස් වෙළෙඳපොළවල කඩාවැටීම/ මිල පහළ යාමේ ප්‍රතිශතය පහත දැක්විය හැකිය.

| කොටස් වෙළෙඳපොල මිල | පහළයාමේ ප්‍රතිශතය (%) |
|---|---|
| ටෝකියෝ | 24 |
| ලන්ඩන් | 21 |
| නිව්යෝක් | 20 |
| ෆ්‍රෑන්ක්ෆර්ට් | 22 |
| ප්‍රංශය | 22 |
| බ්‍රසීලය | 23 |
| ඉන්දියාව | 20 |

2009 සැප්තැම්බර් මාසයේ අවසානයේ සිට 2009.10.10 දින දක්වා කොටස් මිල පහළ යාම හොංකොං වල 59% ක් ද, ජපානයේ 57% ක් ද, චීනයේ 69% ක් ද, ඉන්දියාවේ 51% ක් ද, එංගලන්තයේ 40% ක් ද, ජර්මනියේ 45% ක් ද, ඇමෙරිකාවේ 40% ක්ද ලෙස අධික මට්ටමේ විය. මෙම මිල පහළයාම 1929 මහා අවපාත සමයේ කොටස් මිල පහළ යාමට පමණක් සමාන වේ. කොටස් සහ වාණිජ පත්‍ර නිකුත් කිරීම තුළින් සමාගම් අරමුදල් සපයා ගන්නා බැවින් බැංකු ණය නොලැබීමට අමතරව මෙම අරමුදල් හිඟතාවයන් හේතු කොට ව්‍යාපාරික සමාගම්වල නිෂ්පාදන කටයුතු කෙරෙහි දැඩි බලපෑමක් ඇතිවිය. විශේෂයෙන් වෙළෙඳාම් (ආනයන, අපනයන සහ දේශීය වෙළෙඳාම) කටයුතු බැංකු සහ සුරැකුම් වෙළෙඳපොළ ණය මගින් මූල්‍යකරණය කොට පවත්වාගෙන යන බැවින් වෙළෙඳ සමාගම් දැඩි ව්‍යාපාරික අර්බුදයන්ට මුහුණ දුනි. තවද, මූල්‍ය ආයෝජන අලාභ හේතුකොට පුද්ගලයන් සහ ආයතන ආයෝජන සහ පරිභෝජන කටයුතු සීමා කරන ලදී. එබැවින්, මෙය ආර්ථික අර්බුදයක් බවට පත්විය. ලෝකය ආනයන අපනයනය මත රැකෙන බැවින් සංවර්ධිත රටවල නිෂ්පාදනය, ආයෝජනය සහ පරිභෝජනය පහළයාම තුළින් සමස්ත ලෝක ආනයන සහ අපනයන පහළ යාමත් මූල්‍ය

අර්බුදයක් ඇති නොවූ රටවල පවා ආර්ථිකයන් පහළ යාමත් සිදු විය. 2009 වර්ෂයේ දී ලෝක ආර්ථිකය 0.6% කින් පහළ යන ලදී. ලෝක ආර්ථික අර්බුදය ලෙස හැඳින්වනුයේ මෙයයි. ආර්ථික වර්ධනය පහළයාම හෝ සෘණ වර්ධනය, සේවා වියුක්තිය ඉහළ යාම, රාජ්‍ය ණය සහ අය-වැය හිඟය ඉහළ යාම, ආනයන සහ අපනයන පහළ යාම, සමස්ත භාණ්ඩ හා සේවා ඉල්ලුම පහළ යාම සහ භාණ්ඩ හා සේවා මිල හෝ උද්ධමනය පහළ යාම මෙම ආර්ථික අර්බුදයේ මූලික ලක්ෂණයන්ය.

**(උ) ණය ශ්‍රේණිගත ආයතන වල දූෂිත ශ්‍රේණිගත කිරීම් -** වෙළෙඳපොළේ සියලුම සුරැකුම් පාහේ ණය ශ්‍රේණියක් සහිතව නිකුත් කරනු ලැබූ ඒවාය. ණය ශ්‍රේණිය දෙස බැලීමෙන් ආයෝජකයෙකුට තම ආයෝජනවල ඇති අවදානම හෝ මුදල් අහිමිවීමේ අවදානම පිළිබඳ අදහසක් ලබාගත හැකිය. කලින් කලට සුරැකුම්වල අවදානම අඩු-වැඩි වේ නම් ණය ශ්‍රේණිගත ආයතන විසින් ඊට සරිලන ලෙස ණය ශ්‍රේණිය වෙනස් කොට වෙළෙඳපොළට දැන්විය යුතුය. එහෙත්, සුරැකුම්ගත බැඳුම්කර පිළිබඳව එසේ සිදු නොවීය. ප්‍රමුඛ නොවන උකස් ණය අවදානම ඉතා ඉහළ ගිය ද ඒ මත පදනම් වූ සුරැකුම්ගත බැඳුම්කරවල ණය ශ්‍රේණිය වෙනස් නොකිරීම නිසා ආයෝජකයන් කාලයෙන් කාලයට අවදානම් පිළිබඳ දැනුවත් වී නොතිබිණි. එබැවින්, කෙටිකාලයක් තුළ වෙළෙඳපොළේ වෙනත් තොරතුරු මත අවදානම පිළිබඳ ආයෝජකයන් දැනුම්වත්වීම නිසා එක්වර සුරැකුම්කරණ වෙළෙඳපොළ කඩා වැටුනි. ණය ශ්‍රේණිගත ආයතන විසින් තාක්ෂණිකව එම ශ්‍රේණිගත කිරීම් සේවාව නොකළ බවත් නොයෙකුත් දූෂණ සිදු වී තිබූ බවත් පසුව හෙළි විය. ණය ශ්‍රේණිගත ආයතනවල දූෂිත ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්ති නිසා ආයෝජකයන් මුලා වී තිබීම මූලික හේතුවක් බව පිළිගැනේ.

**(ඌ) බැංකුවල අවදානම් කළමණාකරණයේ විශාල වශයෙන් දුර්වලතා රැසක් තිබීම -**

එනම් -

(i) ප්‍රමුඛ නොවන ණය අධික ලෙස වර්ධනය කිරීම - මෙම ණය සුරැකුම්කරණය තුළින් පහසුවෙන් විකිණීමට හැකි බැවින් ලිහිල් ඇගයීම් මත අධික ලෙස ණය ලබාදීම.

(ii) බැංකුවලට සෘජු අවදානමක් නොමැතිව ආදායම් ලැබෙන බැවින් "තොග ණය ඉම්" විශාල වශයෙන් ව්‍යාපාර ආයතන වලට ලබාදීම - මේවා ශේෂ පත්‍රයෙන් පිටත ගනුදෙනු නිසා අරමුදල් අවශ්‍ය නොවීය. නමුත් මූල්‍ය අර්බුදය නිසා බොහෝ මූල්‍ය ආයතන සහ ව්‍යාපාරික සමාගම් තම හදිසි අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මෙම අනුමත ණය සීමාවන් තුළින් බැංකුවලින් මුදල් ලබා ගැනීමට පෙළඹීම නිසා බැංකුවලට අධික ද්‍රවශීල ප්‍රශ්න ඇති විය. මෙම අරමුදල් සපයා ගැනීමට බැංකුවලට ක්‍රමයක් නොමැති විය.

(iii) බැංකු මූල්‍ය වෙළෙඳපොළ කටයුතුවල නිරතවීම - සම්ප්‍රදායික බැංකුවල ව්‍යාපාරික කටයුත්ත වූයේ තැන්පත් භාර ගැනීම සහ එම තැන්පතු වලින් හොඳ ගනුදෙනුකරුවන්ට කෙටිකාලීන ණය ලබාදීමයි. මෙය සම්බන්ධතා මත බැංකු කටයුතු (Relationship Banking) ලෙස හැඳින්වෙයි. එහෙත්, මූල්‍ය වෙළෙඳපොළවල් දියුණුවීමත් සමඟ බැංකු අවදානම් අඩු කුඩා තැන්පතු රාශිකරණය පිළිබඳ උනන්දුවක් නොදැක්වූ අතර වෙළෙඳපොළ ණය ගැනීම් මගින් අරමුදල් වැඩියෙන් සපයා ගැනීමට පෙළඹෙන ලදී. එසේම, බැංකු තම අරමුදල් මූල්‍ය වෙළෙඳපොළේ ආයෝජනය සහ වෙළෙඳාමෙහි නිරත විය. එබැවින්, බැංකුවල වත්කම් සහ වගකීම් දැඩි ලෙස මූල්‍ය වෙළෙඳපොළ මත රැඳී පැවැති අතර අර්බුදය හේතු කොට සෘජු බලපෑම් දෙකක් සිදු විය. පළමුව වෙළෙඳපොළින් අරමුදල් සපයා ගැනීමට නොහැකිවීමෙන් ද්‍රවශීල අර්බුදයක් ඇති විය. දෙවනුව බැංකු විසින් ද සුරැකුම්ගත බැඳුම්කර ඇතුළු අනෙකුත් වෙළෙඳපොළ සුරැකුම්වල මුදල් ආයෝජනය කොට තිබූ නිසා එම වෙළෙඳපොළවල් කඩා වැටී සුරැකුම් මිල පහළ යාමෙන් බැංකුවල ආයෝජන සුරැකුම්වල වෙළෙඳපොළ වටිනාකම කඩා වැටී විශාල ප්‍රාග්ධන අලාභ සිදු විය. මේ අනුව සම්ප්‍රදායික බැංකු මෙන් නොව මෙම බැංකු දැඩි වෙළෙඳපොළ අවදානමකට මුහුණ දුනි. ණය සුරැකුම්කරණය තුළින් බැංකු උත්සාහ කළේ ණය විකිණීම තුළින් ණය අවදානම කළමනාකරණය කිරීමයි. එහෙත්, ඒ තුළින් බැංකු දැඩි වෙළෙඳපොළ අවදානමකට මුහුණ දෙන පරිදි කටයුතු සිදුකිරීමෙන් අලෙවි කරන ලද ණය අවදානම ද්‍රවශීල අවදානම සහ වෙළෙඳපොළ අවදානම ලෙසින් බැංකු වෙත පැමිණ තිබිණි.

(iv) නියාමන සහ අධීක්ෂණ දුබලතා - මූල්‍ය නියාමකයින් විසින් අවදානම් කළමනාකරණය සඳහා යොදා ගත් නව මූල්‍ය උපකරණ සඳහා අභිමතය දෙන ලදී. මේ සඳහා උදාහරණ රාශියක් දැක්විය හැකිය.

- ආයෝජන බැංකු කටයුතු කිරීමට බැංකුවලට අනුමැතිය දීම - ඇමෙරිකාවේ 1933 ග්ලාස්-ස්ටීගල් පනත (Glass-Steagall Act) මගින් වාණිජ බැංකු, ආයෝජන බැංකු වලින් වෙන් කොට බැංකුවලට ආයෝජන වෙළෙඳ කටයුතු කිරීම අත්හිටුවන ලදී. එහෙත්, 1999 ග්‍රෑම්-ලීච්-බිලී පනත මගින් (Gramm-Leach-Biley Act) බැංකුවලට ආයෝජන බැංකු කටයුතු සඳහා අවසර දෙන ලදී. මේ නිසා බැංකු විසින් විශාල මූල්‍ය සුපිරි වෙළෙඳසැල් ලෙස බැංකු කටයුතු, සුරැකුම් වෙළෙඳාම (ආයෝජන බැංකු) සහ රක්ෂණ කටයුතු වැනි සෑම මූල්‍ය සේවා අංශයක ම නිරත විය. මේ හේතු කොට බැංකු ආර්ථිකයේ සෑම අංශයකට ම සම්බන්ධවීමෙන් අවදානම් වැඩිවිය.

- ණය සුරැකුම්කරණයට අනුබලදීම - බැංකු විසින් ණය විකිණීම නිසා ශේෂ පත්‍රයේ ණය වෙනුවෙන් තබාගත යුතු ප්‍රාග්ධනය අඩුවන බැවින් ප්‍රාග්ධන අනුපාතය ඉහළ යාම හොඳ සාධකයක් විය. තවද, බැංකු නොයෙකුත් මූල්‍ය ව්‍යුත්පන්න

උපකරණ ගනුදෙනුවල යෙදීමෙන් අවදානම් ආවරණය කළ හැකි නිසා මූල්‍ය ව්‍යුත්පන්න වෙළෙඳපොළවල ගනුදෙනුවලට ඉඩ ලැබිණ. මේ මගින් වෙළෙඳපොළ අවදානම ඇති විය.

- වෙළෙඳපොළ මිල (Fair Value) අනුව සුරැකුම් වටිනාකම වෙළෙඳ ගිණුම්වල සටහන් කිරීමේ ගණකාධිකරණ අවශ්‍යතාවය - මේ නිසා වෙළෙඳාම් කෙරෙන සුරැකුම් ආයෝජනවල වටිනාකම ඒවායේ පවතින වෙළෙඳපොළ මිල අනුව පොත්වල සටහන් කිරීමට බැංකුවලට සිදු විය. මූල්‍ය වෙළෙඳපොළවල් කඩාවැටීම නිසා සුරැකුම් මිල ශූන්‍යයට ආසන්න මට්ටමට පහළ ගිය අතර ඒ අනුව සුරැකුම් වටිනාකම ගිණුම්ගත කිරීම හේතු කොට බැංකුවලට අධික අලාභ සිදු වී බැංකු ප්‍රාග්ධනය ක්ෂය විය. මූල්‍ය වෙළෙඳපොළවල පසුබෑම නිසා නව ප්‍රාග්ධනය ලබා ගැනීම ද අපහසු විය.

- බැංකුවල ද්‍රවශීලතාවය යම්කිසි ප්‍රතිශතයක ද්‍රවශීල වත්කම් තබාගත යුතු බවට කොන්දේසිය (උදා. වත්කම්වලින් 20% ක්) අනුගමනය නොකොට බැංකුවල වත්කම් සහ වගකීම් පරිණත අසමතාවය කළමනාකරණය තුළින් ද්‍රවශීල අරමුදල් සපයා ගැනීමට බැංකුවලට නිදහස දීම - මෙම කළමනාකරණ ක්‍රමයන් සංඛ්‍යාත්මක අභ්‍යාස වූ අතර ද්‍රවශීල අරමුදල් ප්‍රමාණවත්ව පවත්වා නොගැනීමෙන් බැංකුවලට ද්‍රවශීල අර්බුදය පාලනය කරගත හැකි නොවීය.

- වෙළෙඳපොළ පදනම් වූ අධීක්ෂණ ක්‍රම අනුගමනය කිරීම - මෙහි දී බැංකුවලට අවදානම් කළමනාකරණයට සෑහෙන නිදහසක් ලැබුණ අතර දුර්වල අවදානම් කළමනාකරණය හේතුකොට බැංකු බුන්වත් වීමට ඉඩ දියයුතු බව අදහස් කෙරින. යුරෝපීය රටවල කොන්දේසි සහ නීති වලට වඩා ප්‍රතිපත්ති මත පදනම් වූ (Principle-based) අධීක්ෂණ ක්‍රමයක් අනුගමනය කරන ලදී. මේ නිසා බැංකු ව්‍යාපාරික කටයුතුවල දී පිළිපැදිය යුතු කොන්දේසි සහ විධානයන්ගේ ප්‍රමාණය අඩු විය. බැංකු අධීක්ෂණය මූලික වශයෙන් බාසල් ප්‍රාග්ධන සම්මතය/අනුපාතය හා බැඳුන අතර බාසල් II සම්මතය තුළින් බැංකු වලට ප්‍රාග්ධනය තබා ගැනීම පිළිබඳ විකල්ප අවස්ථා ලබා දෙන ලදී. එහෙත්, බැංකු විසින් ප්‍රාග්ධනය නිවැරැදිව තබාගනී ද යන්න පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය දුබල මට්ටමක තිබීමෙන් බැංකු බොහෝවිට අඩු ප්‍රාග්ධනයකින් වැඩි අවදානම් සහිත ව්‍යාපාර කරන ලදී.

- බොහෝ රටවල මහ බැංකු වලින් බැංකු නියාමනය සහ අධීක්ෂණය ඉවත් කොට වෙන ම රාජ්‍ය නියාමන අධිකාරියක් ඇති කිරීම - මහ බැංකුව යටතේ බැංකු අධීක්ෂණය තිබෙන විට බැංකුවල ද්‍රවශීල ප්‍රශ්න ඇතිවිට ඒවා ඉක්මනින් හඳුනාගෙන මහ බැංකුවෙන් ණයදීම තුළින් ඉක්මනින් ඒවා විසඳාගත හැකිය. තවද, මූල්‍ය වෙළෙඳපොළවල් සහ ආයෝජකයන් මහ බැංකුවේ මූල්‍ය සහ අධීක්ෂණ ශක්තිය පිළිබඳ වැඩි විශ්වාසයක් සම්ප්‍රදායෙන් ම පවතී. රාජ්‍ය නියාමන සහ අධීක්ෂණ අධිකාරියට බැංකු වලට ණයදීම සඳහා මූල්‍ය සම්පත් නොමැති බැවින් බැංකුවල ද්‍රවශීල අර්බුදයක දී විසඳුම් දිය නොහැකිය. ඒ සඳහා මහ බැංකුව ඉදිරිපත්වීම මෙවැනි අධීක්ෂණ රාමුවක දී ඉතා ප්‍රමාද වනු ඇත. එවිට, බැංකු අර්බුදය ඉක්මනින් පැතිරී ගොස් තිබිය හැකිය. විශේෂයෙන් එංගලන්තයේ බැංකු අර්බුදයේ දී මෙය දක්නට ලැබිණ.

- විශාල මූල්‍ය සමූහයන් (Financial Conglomerates) ලෙස ක්‍රියාත්මක වූ බැංකු විසින් අධීක්ෂණයට හසු නොවූ (Regulatory Arbitrage) මූල්‍ය සහ වෙළෙඳ ව්‍යාපාරවල නිදහසේ යෙදීමෙන් වැඩි අවදානම්වලට මුහුණ දීම - විශාල මූල්‍ය සමූහයන් අධීක්ෂණය කිරීමට අවශ්‍ය නීතිරීති සහ ක්‍රමවේදයන් නොතිබීම ද මහත් දුබලතාවයක් විය.

- බැංකු සේවකයන්ට දෙන ලද දිරිදීමනා - බැංකු සේවකයන් විසින් ඉදිරිපත් කරන ලද නව මූල්‍ය ගනුදෙනු උපකරණ සඳහා දිරිදීමනා ක්‍රම විශාල වශයෙන් ක්‍රියාත්මක විය. මේවා නිසා අවදානම් සහිත එහෙත්, වැඩි ලාභයක්/ආදායමක් ලබන මූල්‍ය වෙළෙඳාම් කටයුතුවල යෙදීමට බැංකු සේවකයන් දිරිගන්වන ලදී. මේ නිසා බැංකු සේවකයන් නොයෙකුත් අවදානම් සහිත සංකීර්ණ නව මූල්‍ය උපකරණ හඳුන්වා දුනි. බැංකුවල වෙළෙඳපොළ අවදානම වැඩිවීමට මූලික හේතුව මෙයයි.

**(එ) විදේශ රටවලට මූල්‍ය අර්බුදය පැතිරීයාම -** මෙය හේතු තුනක් මත මූලික වශයෙන් ඇතිවිය. පළමුව, එම රටවල බැංකු ඇමෙරිකාව සහ යුරෝපයේ සුරැකුම්කරණ වෙළෙඳපොළෙහි සුරැකුම්ගත බැඳුම්කරවල මුදල් ආයෝජනය කොට තිබීම නිසා අලාභ සිදුවිය. දෙවනුව, එම රටවල මුදල් ආයෝජනය කොට තිබූ විදේශීය ආයෝජකයන් සංවර්ධිත රටවල ආයෝජනවලින් සිදු වූ අලාභ පියවීමට මෙම රටවල ආයෝජනයන් ආපසු ගැනීමට පෙළඹින. මේ නිසා මෙම රටවල් දැඩි විදේශ විනිමය අර්බුදයන්ට මුහුණ දුනි. තෙවනුව, සංවර්ධිත රටවල භාණ්ඩ හා සේවා ඉල්ලුම අඩුවීම හේතු කොට සංවර්ධනය වන රටවල අපනයන අඩුවීම නිසා විදේශ විනිමය සහ දේශීය ආර්ථික කටයුතුවලට දැඩි බලපෑමක් ඇතිවිය. මේ හැර මෙම රටවල ද තැනින් තැන බැංකු සහ මූල්‍ය ආයතන පිළිබඳ විශ්වාසය බිඳවැටී බැංකු අර්බුද ඇතිවිය.

**(ඒ) ඇමෙරිකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය හේතු කොට වත්කම් බුබුළු හටගැනීම -** වර්ෂ 2000 පමණ සිට 2004 මැද පමණ වන විට ෆෙඩරල් අරමුදල් පොළී අනුපාතය 1% දක්වා අඩුකිරීමත් එතැන් සිට 2007 අවසාන කාලය දක්වා පමණ 5.25% දක්වා වැඩිකිරීමත් වත්කම් බුබුළු ඇති වී පිපිරී යාමක් ලෙස දක්වයි. පොළී අනුපාත අඩුකරන විට මූල්‍ය වත්කම්වල මිල වැඩි වී වත්කම් මිල බුබුලක් ඇති වී පොළී අනුපාත ඉහළ නැංවූ විට වත්කම් මිල පහළ යාමක් සිදු වෙයි. මූල්‍ය අර්බුදය යනු මෙසේ වත්කම් මිල පහළ යාමයි. මීට සමාන මූල්‍ය ප්‍රතිපත්තියක් යුරෝපයේ සහ බොහෝ රටවල ද දක්නට ලැබිණ. මූල්‍ය අර්බුදයෙන් සිදු වූ හානිය ප්‍රතිපූරණය සඳහා

ඇමෙරිකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල් පොළී අනුපාත ක්‍රමානුකූලව පහත දැමීය. ඇමෙරිකාවේ පොළී අනුපාතය ශූන්‍යයට ආසන්න මට්ටමකට, එනම් ෆෙඩරල් අරමුදල් අනුපාතය 0%-0.25% දක්වා ද, එංගලන්තයේ මහ බැංකු පොළී අනුපාතය 0.5% දක්වා ද යුරෝපීය මහ බැංකුවේ ණය දෙන අනුපාතය 1% දක්වා ද අඩු කරන ලදී. මේ මගින් ණය ගැනීම සහ මූල්‍ය වත්කම්වල ආයෝජනය දිරිමත් කිරීම සිදු කෙරේ.

**(ඔ)** 2008 සැප්තැම්බර් 15 දින අවුරුදු 158 පමණ පැරැණි ඩොලර් බිලියන 690 ක පමණ වත්කම් (ශ්‍රී ලංකාවේ ජාතික ආදායම මෙන් 16 ගුණයක් විශාල) ඇති ලෝක ප්‍රසිද්ධ නිව්යෝර්ක් නගරයේ වොල් මාවතේ (Wall Street) පිහිටි විශාලම ආයෝජන බැංකු 5 න් එකක් වූ ලේමන් බ්‍රදර්ස් (Lehman Brothers) ඈවර කිරීම සඳහා නීතිමය කටයුතු ඇරඹීම ලෝක මූල්‍ය අර්බුදයේ විශේෂ සිද්ධියක් විය. ඊට හේතුව මේ නිසා මූල්‍ය ආයතන රාශියක් අර්බුදයට ලක්වීමයි. මෙම අර්බුදයට ලක් වූ මූල්‍ය ආයතන අතර ඇමෙරිකාවේ පිහිටි ලෝකයේ විශාලතම රක්ෂණ සමාගමක් වන ඩොලර් බිලියන 1,000 ක පමණ වත්කම් ඇති ඒ අයි ජී (AIG - American Insurance Group) විය. මීට මූලික හේතුව වූයේ ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව විසින් නිකුත් කොට තිබූ සුරැකුම්ගත බැඳුම්කර ඒ අයි ජී විසින් "ණය පැහැර හැරීම් හුවමාරු" (Credit Default Swap) නමැති මූල්‍ය උපකරණය මගින් රක්ෂණය කොට තිබීමයි. මෙම බැඳුම්කර සඳහා මුදල් ගෙවීමට ලේමන් බ්‍රදර්ස්ට නොහැකි වූ බැවින් (ඈවර කිරීමට තීරණය කිරීම) රක්ෂණ ක්‍රමය යටතේ ඒ අයි ජී විසින් ඒවා ගෙවිය යුතුය. මෙසේ ගෙවීමට සිදු වූ මුදල් ඉතා විශාල වූ බැවින් ඒ අයි ජී දැඩි මූල්‍ය අර්බුදයකට ලක් විය. මහ බැංකුව සහ ඇමෙරිකන් රජය විසින් ඒ අයි ජී යට ඩොලර් බිලියන 180 ක් පමණ අරමුදල් ලබා දී බේරාගන්නා ලදී. එබැවින්, ඒ අයි ජී දැනට රාජ්‍ය රක්ෂණ සමාගමකි. ලේමන් බ්‍රදර්ස් නව අයිතිකරුවකුට ලබාදීමට ඇමෙරිකන් රජය උත්සාහ කළ ද එය අසාර්ථක වන ලදී.

## 3. විසඳුම් ක්‍රියාමාර්ග

අර්බුදය විසඳීම සඳහා රජයන් සහ මහ බැංකු අඛණ්ඩව මැදිහත්වීම සිදු විය. මෙම අර්බුදය වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයේ අර්බුදයක් වන බැවින් එය විසඳාලීම සඳහා මහජන විශ්වාසය ඇති කිරීමටත් ආර්ථිකයට අරමුදල් ලබාදීමටත් රජයේ මැදිහත්වීම අවශ්‍ය විය.

**(අ)** මුලින් ම බැංකු සහ මූල්‍ය වෙළෙඳපොළවල අරමුදල් හිඟතාවය පියවීම සඳහා මහ බැංකු තම ණය පොළී අනුපාත අඩුකොට සීමාවල් ලිහිල් කොට වෙළෙඳපොළට විශාල වශයෙන් අරමුදල් ලබාදුනි - මෙය ක්‍රම කිහිපයකට සිදු කෙරින. එනම් බැංකුවලට සෘජු ණය ලබාදීම (අවසාන ණය දෙන්නා ලෙස), මූල්‍ය වෙළෙඳපොළෙන් වාණිජ පත්‍ර සහ විවිධ සුරැකුම්ගත බැඳුම්කර මිලදී ගැනීම, බැංකු සතු සුරැකුම්ගත බැඳුම්කර මිලදී ගෙන ඒ වෙනුවට වෙළෙඳපොළේ විකුණා මුදල් ලබාගත හැකි රාජ්‍ය සුරැකුම්පත් ලබාදීම යනාදියයි. මෙසේ අරමුදල් ලබාදීම සඳහා මහ බැංකු විසින් ඉතා අධික මුදල් ප්‍රමාණයක් මුද්‍රණය කරන ලදී. උදාහරණ ලෙස ඇමෙරිකාවේ පමණක් මහ බැංකුවේ වත්කම් ඩොලර් ට්‍රිලියන 0.9 සිට 2.3 දක්වා මේ නිසා ඉහළ යන ලදී.

**(ආ)** මීට අමතරව රජයන් විසින් ආර්ථිකය දිරිමත් කිරීමේ අරමුදල් (Stimulus Packages) බැංකු සහ ව්‍යාපාරික ආයතනවලට ලබා දුනි - බැංකුවල ණයකර සහ කොටස් මිලදී ගැනීම තුළින් අරමුදල් ලබාදීම නිසා බොහෝ ජාත්‍යන්තර බැංකු රාජ්‍ය බැංකු බවට පත්විය. ඇමෙරිකාවේ රජය විසින් ඩොලර් බිලියන 700 ක අරමුදලක් ඇති කොට ඒ මගින් සුරැකුම්ගත බැඳුම්කර වැනි බාල වත්කම් මිලදී ගැනීම තුළින් බැංකුවලට අරමුදල් ලබා දෙන ලදී.

**(ඇ)** මූල්‍ය අර්බුදය ඇතිවූ විගස රජයන් විසින් බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු, ණය ගැනීම් සහ දෙන ලද ණය පිළිබඳ රාජ්‍ය ඇපය ලබාදීම - මෙය බැංකු හා මූල්‍ය ආයතන පිළිබඳව ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ගොඩනැංවීමට සහ ආරක්ෂා කිරීමට හේතු විය.

**(ඈ)** බැංකු සහ මූල්‍ය ආයතනවල කොටස් මිල පහළයාම වැළැක්වීම සඳහා "නොමැති කොටස් අලෙවිය" (Short Selling) අත්හිටුවීම - නොමැති කොටස් අලෙවිය හෙවත් ණයට කොටස් ගෙන අලෙවි කිරීම ඉක්මනින් මිල පහළ යාම ඇතිකරවන සාධකයකි.

**(ඉ)** අර්බුදයට පත් බැංකු පිළිබඳ විවිධ විසඳුම් ක්‍රියාමාර්ග ගැනීම - මේ යටතේ සමහර බැංකු වෙනත් බැංකු සමඟ ඒකාබද්ධ කිරීමත් සමහර බැංකු නීති මගින් ඈවර කිරීමටත් බැංකු නියාමන අධිකාරීන් විසින් කටයුතු කරන ලදී. සමහර බැංකුවල අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කොට නව ප්‍රාග්ධනය රැගෙන ඒමට ක්‍රියාමාර්ග ගැනීම කරන ලදී.

**(ඊ)** සුරැකුම්ගත බැඳුම්කර සහ ණය ව්‍යුත්පන්න සුරැකුම් වෙළෙඳාම සඳහා සංවිධිත හුවමාරු (Organised Exchanges) ඇති කිරීමට යෝජනා කිරීම - පසුගිය දශක කිහිපය තුළ මෙම සුරැකුම් මූල්‍ය සහ ආර්ථික ක්‍රමයන්හි දියුණුවට ඉතාමත් දායක වී ඇති අතර මූලික දුර්වලතාවය වූයේ මෙම සුරැකුම්වල නොව සුරැකුම් ගනුදෙනු ක්‍රමයෙහිය. මෙම සුරැකුම් පෞද්ගලික ක්‍රමයට (Over-the-Counter Trade) වෙළෙඳාම් කළ නිසා නොයෙකුත් අක්‍රමිකතාවයන් සිදු වී ඇත. සුරැකුම් පිළිබඳ නියම තොරතුරු ආයෝජකයන්ට ලැබී නොමැත. එබැවින්, මෙම සුරැකුම් වෙළෙඳපොළවල් තවදුරටත් ආරක්ෂා කොට දියුණු කිරීම සඳහා සංවිධිත සුරැකුම් හුවමාරුවල ගනුදෙනු කිරීමට අවශ්‍ය නීතිරීති ගෙන ඒම සඳහා යෝජනා වී ඇත.

(ඇ) මෙම අර්බුදයෙන් ලද පාඩම් තුළින් අනාගතයේ බැංකු අර්බුද වැළැක්වීම සඳහා බැංකු නියාමනය සහ අධීක්ෂණය වැඩි කිරීමට නව නීතිරීති ගෙන ඒමට සෑම රටක් ම පාහේ දැනට කටයුතු කිරීම. ඇමෙරිකාවේ සහ එංගලන්තයේ යෝජිත නීති අතර වාණිජ බැංකුවලින් ආයෝජන බැංකු කටයුතු වෙන් කිරීම විශේෂ පියවරකි. විශාල බැංකු කුඩා බැංකු බවට කොටස් කිරීම, බැංකු සේවා බොහෝ දුරට පාරිභෝගික සේවා බවට පත්කොට සංකීර්ණ මූල්‍ය වෙළෙඳ ගනුදෙනු කිරීම සීමා කිරීම පිළිබඳව ද යෝජනා වී ඇත. බැංකුවල ප්‍රාග්ධනය වැඩි කිරීම සහ ද්‍රවශීල වත්කම් තබා ගැනීම පිළිබඳ නව බැංකු නීති ගෙන ඒමට කටයුතු කෙරේ. තවද, අනාගත මූල්‍ය අර්බුදවල දී බැංකුවලට අරමුදල් ලබාදීම සඳහා අරමුදලක් ඇතිකිරීම පිණිස මූල්‍ය වගකීම් බද්ද ලෙස බැංකුවල ණය වගකීම් වලින් 0.15% ක බද්දක් ද බැංකු සේවක බෝනස්වලින් 50% ක් වැනි බද්දක් අය කිරීම ද යෝජනා වී ඇත. තවද, බැංකු අධීක්ෂණය මහ බැංකුවෙන් පිටත ක්‍රියාත්මක වන රටවල නැවතත් එය මහ බැංකුව වෙත පැවරීමේ යෝජනා ද ඉදිරිපත් වී ඇත.

මෙම මූල්‍ය අර්බුදය සංවර්ධිත රටවල රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළට මුල දී ව්‍යාප්ත නොවූ අතර ඉදිරියේ දී එම වෙළෙඳපොළට ද මෙය ව්‍යාප්ත වේ යැයි බියක් පවතී. මෑත කාලයේ ග්‍රීසියේ වූ ණය අර්බුදය මීට උදාහරණයකි. ග්‍රීසියේ රාජ්‍ය වියදම් අධික බැවින් ඒවා මූල්‍යකරණයට රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම මගින් මුදල් සපයා ගෙන ඇත. ග්‍රීක් රජයේ මූල්‍ය ශක්තිය පිළිබඳ ආයෝජකයන් තුළ ඇති වූ සැකය නිසා ග්‍රීක් රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම අපහසු විය. මෙය යුරෝ කලාපයේ රටවල් කිහිපයකට පැතිරෙන්නට වූයෙන් යුරෝපීය හවුල විසින් යුරෝ කලාපයේ රාජ්‍යවල සුරැකුම්පත් නිකුත් කිරීම පිළිබඳ අර්බුදය විසඳා ගැනීමට ආධාර කරන ලදී. මේ අනුව යුරෝ බිලියන 750 ක "ජාත්‍යන්තර ගැලවුම් පැකේජයක්" (International Rescue Package) යුරෝ රටවල ණය ගැටළුව විසඳීමට 2010 මැයි මාසයේ දී ඉදිරිපත් කරන ලදී. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ලෙස යුරෝ බිලියන 250 ක් ද, යුරෝපීය හවුලෙන් යුරෝ බිලියන 60 ක් ද, යුරෝ කලාපයෙන් ණය ඇප ආවරණ ලෙස යුරෝ බිලියන 440 ක් ද විය. මීට අමතරව යුරෝපීය මහ බැංකුව විශාල වශයෙන් යුරෝපීය රාජ්‍යයන් විසින් නිකුත් කරන රාජ්‍ය බැඳුම්කර මිලදී ගැනීමට ඉදිරිපත්වන ලදී.

2011 වර්ෂයේ දී ග්‍රීසියට තම ණය ගෙවීමට නොහැකි තත්ත්වයට මුහුණ දුන් අතර යුරෝපීය හවුලේ රජයන්ගේ මැදිහත්වීමෙන් මෙම ණය දිගුකාලීන ණය බවට ප්‍රතිලේඛනගත කොට ණය පැහැර හැරීමේ තත්ත්වයෙන් මුදවාලීය. තවද, 2011 ජූලි මාසය වන විට ඇමෙරිකානු එක්සත් ජනපද රජයට ද තම ණය ගෙවීමට අපහසු තත්ත්වයකට මුහුණ දුනි. ඊට හේතුව එරට පාර්ලිමේන්තුව විසින් අනුමත ණය සීමාව වන ඇ.එ.ජ. ඩොලර් ට්‍රිලියන 13.4 ක මට්ටමට පැමිණි බැවින් ණය ගෙවීම සඳහා තවදුරටත් ණය ගත නොහැකි වීමයි. පාර්ලිමේන්තුව විසින් 2011 අගෝස්තු මාසයේ මෙම ණය සීමාව තවත් ඩොලර් ට්‍රිලියන 2.4 කින් ඉහළ දැමීමෙන් ණය ගැටළුව තාවකාලිකව විසඳන ලදී. අයර්ලන්තය, ස්පාඤ්ඤය, ඉතාලිය සහ පෘතුගාලය රාජ්‍ය ණය අර්බුදයට මුහුණ දුන් අනෙක් ප්‍රධාන යුරෝපීය රටවල්ය. 2009 දෙසැම්බර් මාසයේ දී ඩුබායි රජයට සම්බන්ධ මහා පරිමාණ සමාගම් විසින් ජාත්‍යන්තර වශයෙන් ණය ලබාගැනීම සඳහා නිකුත් කොට තිබූ බැඳුම්කර පිළිබඳව විශ්වාසය පළුදුවීමේ සිද්ධියක් ද වාර්තා විය. එය ද අරාබි රටවල සහයෝගයෙන් විසඳා ගන්නා ලදී. මේ අනුව අනාගතයේ දියුණු සහ දියුණුවන රටවල රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළේ ද අර්බුදයන් වරින්වර ඇතිවෙමින් වත්මන් ලෝක මූල්‍ය අර්බුදය තවත් ව්‍යාප්ත විය හැකි බවට අදහස් පළ වී තිබේ. කෙසේ වුවද 2010 වර්ෂයේ සිට ලෝකය මෙම අර්බුදයෙන් මිදෙමින් ආර්ථික වශයෙන් ප්‍රගතිය ලබමින් පවතී.

17 වන පිටුවෙන්...

ව්‍යාජ මුදල් මිලියන ගණනක් යුදෙව් ජාවාරම්කරුවන් අතට පත් ව ඒවා යුදෙව් සරණාගතයින් පලස්තීනයට ගෙන යෑමට ද යොදාගෙන ඇත. මෙම ව්‍යාජ මුදල් මෙහෙයුම මුලුමනින් ම සාර්ථක කර ගැනීමට නාසීහු අසමත් වුව ද ඉන් ඇති කළ බලපෑම සුවිශාල ය. සංසරණය සඳහා මුදාහරින ලද ව්‍යාජ මුදල් අවුරුදු කිහිපයක් තිස්සේ එංගලන්තයේ පැවතිනි.

එම නිසා එංගලන්ත බැංකුව 1943 දී පවුම් 5 නෝට්ටුව හැර අන් සියලු ම නෝට්ටු සංසරණයෙන් ඉවත් කරන ලද අතර 1945 පවුම් 5 නෝට්ටුව නැවත සැලසුම් කරන ලදී. 1957 පෙබරවාරි 21 දින නිල් පැහැයෙන් යුතු නව පවුම් 5 නෝට්ටුව නිකුත් කිරීමට පියවර ගත්තේ ය. එ මෙන් ම, 1964 පෙබරවාරි 21 දින පවුම් 10 නෝට්ටුව ද 1970 ජූලි 9 දින පවුම් 20 නෝට්ටුව ද 1981 මාර්තු 20 දින පවුම් 20 නෝට්ටුව ද අලුතින් නිකුත් කිරීමට පියවර ගත්තේ ය. කෙ සේ වෙතත් හිට්ලර් ගේ දැවැන්ත ව්‍යාජ මුදල් මුද්‍රණ ව්‍යාපෘතිය ඔවුන් අපේක්ෂා කළ පරිද්දෙන් ම සාර්ථක කර ගැනීමට හැකි විණි නම් දෙවන ලෝක සංග්‍රාමයෙහි අවසන් ප්‍රතිඵලය ඉතාමත් වෙනස් ආකාරයක එකක්වීමට ඉඩ තිබිණි.

සිය ජීවිතය උදෙසා යුදෙව් සිරකරුවන් එ සේ ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදුණේ නාසීන් විසින් එ වැනි කටයුතු සඳහා ම ඉදිකරන ලද මුද්‍රණාලයක් තුළ ය. එහෙත් එම මුද්‍රණාලය ඉතාමත් ම රහසිගත එකක් විය. එහෙත් ඇතැමකු ව්‍යාජ මුදල් නිෂ්පාදනයේ යෙදුණේ නීත්‍යානුකූල මුදල් නිෂ්පාදනය සඳහා බලය ලත් ආයතන හරහා ම ය. ව්‍යාජ මුදල් නිෂ්පාදනය පිළිබඳ මී ළඟ ලිපියෙන් එවන් අවස්ථාවක් පිළිබඳ ව විස්තර කෙරේ.

# නවතම මහ බැංකු ප්‍රකාශන

**ආර්ථික හා මූල්‍ය විෂයයන් සම්බන්ධයෙන් මහජනයා දැනුම්වත් කිරීම තම වගකීමක් ලෙසින් මහ බැංකුව සළකයි. ඒ අනුව, විවිධ ප්‍රකාශන නිරන්තරයෙන් මහජනයා අතට පත් කෙරෙන අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද සංවිධානය කෙරෙයි. මෙ ලෙස මහ බැංකුව විසින් මෑතක දී ප්‍රකාශයට පත් කළ නවතම ප්‍රකාශන වනුයේ "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" සහ "පහසුවෙන් සිටින් - උද්ධමනයේ කතාව" ග්‍රන්ථ දෙක යි.**


## මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය

පී. සමරසිරි


ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පොතපත ඉතා ම විරල ය. සංකීර්ණ විෂයය කරුණු පිළිබඳ ව න්‍යායාත්මක ව හා ප්‍රායෝගික ව අදහස් පළ කරමින් ඉතා සරල බස් වහරකින් රචිත මෙම ග්‍රන්ථය පරිශීලකයන්ට ඉමහත් වූ සේවයක් සළසනු නිසැක ය.

අඩංගු විෂයය කරුණු දෙස බැලීමේ දී අ.පො.ස. උසස් පෙළ, විශ්වවිද්‍යාල සහ වෘත්තීමය පාඨමාලාවලට අදාළ ව මූල්‍ය හා ආර්ථික විද්‍යා මූලධර්ම හදාරන සිසුන්ට ද ඔවුනට ඉගැන්වීමෙහි නියැලෙන ගුරුවරුන්ට ද එයට අමතර ව ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද මෙම ග්‍රන්ථය අතිශයින් ප්‍රයෝජනවත් බව පැහැදිළි වෙයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2010 අගෝස්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය" ග්‍රන්ථයේ කතුවරයා ද මෙම ග්‍රන්ථය රචනා කළ සහකාර අධිපති සමරසිරි මහතා ම ය. එම ග්‍රන්ථය වසරක් ඇතුළත තෙ වරක් මුද්‍රණය කිරීමෙන් ම කතුවරයාට ඇති පිළිගැනීම තහවුරු වෙයි.




මිල රු.400/=




මිල රු.125/=

## පහසුවෙන් සිටින්

### උද්ධමනයේ කතාව

**මෙම චිත්‍ර කතාව තුළින්**

උද්ධමනය යනු කුමක් ද

උද්ධමනයට හේතු මොනවා ද

පුද්ගලික මට්ටමින් හා පොදුවේ ආර්ථිකයට උද්ධමනය බලපාන්නේ කෙසේ ද

උද්ධමනය පාලනය කරගත හැක්කේ කෙසේ ද

උද්ධමනය මනින්නේ කෙ ලෙසින් ද

යන ගැටලුවලට ඉතා සරල ආකාරයකින් පිළිතුරු සපයයි.

**ලබාගත හැකි ස්ථානඃ රාජගිරිය මහ බැංකු විදුපියස අලෙවි කවුළුව, ගුණසේන, සරසවි, ගොඩගේ ඇතුළු අනෙකුත් පොත් හල්**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.